රණවිරුවාණෙනි, ඔබ දේශයේ අභිමානයයි

இராணுவ வீரர்களே, நீங்கள் இத் தேசத்தின் மகிமைக்குரியவர்கள

Beloved War Hero, You are the Pride of the Nation

# 2017

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report


රණවිරු සේවා අධිකාරිය

ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය

ரணவிரு சேவா அதிகாரசபை

பாதுகாப்பு இராஜாங்க அமைச்சு

Ranaviru Seva Authority

State Ministry of Defence

# 2017
# වාර්ෂික වාර්තාව

**රණවිරු සේවා අධිකාරිය**

**ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය**

# 2017 වර්ෂයට ප්‍රවේශයක්

රටතුල යුධ ගැටුම් අවසන් වී වසර 07 ක් ගෙවී ගොස් තිබුණ ද යුද්ධය විසින් ඊට සෘජුව දායක වූ රණවිරුවිරුවන්ට හා එයට වක්‍රව දායක වූ රණවිරු පවුල් සාමාජික සාමාජිකාවන්ට තීව්‍ර බලපෑමක් කර ඇත. එම බලපෑම් හී අතුරු ප්‍රතිඵල හා එම ප්‍රතිඵලයන් හේතු කොට ගෙන රණවිරු පවුල් සාමාජිකයන්ගෙන් සැලකිය යුතු පිරිසක් සංකිරණ මනෝ සාමාජීය හා ආර්ථික ගැටළු වලට මුහුණපා ඇති බව හඳුනාගැනීමට හැකිව ඇත.

2017 වර්ෂයට අදාල සැලසුම් සැකසීමේදී හා ක්‍රියාත්මක කිරිමේදී හඳුනා ගන්නා ලද වඩාත් සංවේදී හා සංකීරණ ගැටළු කෙරෙහි අවධානය යොමු කර ඇත. යුද්ධය අවසන්ව වසර 7 ක් ගතවී තිබුණ ද තවදුරටත් තමන්ගේම නිවසක අයිතිය නොමැති රණවිරු පවුල් වෙත නිවසක අයිතිය හිමිගැන්වීමේ " විරුසුමිතුරු " නිවාස ව්‍යාපෘතිය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා එක්ව ක්‍රියාවට නැංවීමට 2017 වර්ෂය තුල සැලසුම් කර ඇත.

යුද්ධය හේතුකොටගෙන මනෝ සමාජීයව වඩාත් සංකීරණ ගැටළු වලට මුහුණ පා ඇති කාන්තාවන් හා රණවිරු දරුවන් ඉලක්ක කොට රණවිරු කාන්තා හා ළමා සංවර්ධන අංශයක් ආයතනයේ ස්ථාපිත කොට විධිමත් සැලසුමකට අනුව කාන්තාවන් හා දරුවන් මනෝ සමාජීය මෙන්ම ආර්ථිකව බල ගැන්වීමේ වැඩසටහනක් ඒ තුලින් ක්‍රියාවට නැංවීමට කටයුතු කර ඵලදායී ප්‍රතිඵල ලබාගෙන ඇත.

එමෙන්ම ආයතනයේ කාර්යය මණ්ඩලය වර්ථමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන ලෙස පුහුණු කිරිමට හා ආකල්ප සංවර්ධනය කිරිමට ද කටයුතු කර ඇත. එමගින් වඩාත් කාර්යක්ෂම සේවයක් සේවාලාභීන් වෙත ලබාදීමට හැකි වී ඇත.

ඊට අමතරව ආයතනය ආරම්භයේ සිට ක්‍රියාත්මක කරන ලද සුභසාධන කටයුතු වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කරන ලදි.

# පටුන


රණවිරු සේවා අධිකාරිය ........ 1

අපේ දැක්ම හා අපේ මෙහෙවර ........ 2

රණවිරු සේවා අධිකාරියේ කර්තව්‍ය ........ 3

සභාපතිතුමියගේ පණිවුඩය ........ 4

ආයතනික අධ්‍යක්ෂ මණ්ඩලය ........ 5

අපගේ ක්‍රියාත්මක ව්‍යාපෘති ........ 6

01. ආබාධිත රණවිරු පසු උවටැන සහ පුනරුත්ථාපනය ........ 7 - 9
   1.1. ආබාධිත උපකරණ ලබා දීම
   1.2. සනීපාරක්ෂක ආධාර ලබා දීම
   1.3. ආබාධිත රණවිරු පුහුණු වැඩමුළු පැවැත්වීම

02. රණවිරු නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම ........ 10 - 15
   2.1. විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය
   2.2. නිවාස ණය ලබා දීම
   2.3. හදිසි ආපදාවන්හිදි මුල්‍යාධාර ලබාදීම
   2.4. ඉඩම් ලබා දීම

03. වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම ........ 16 - 19
   3.1. වෛද්‍ය සායන පැවැත්වීම
   3.2. සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩමුළු පැවැත්වීම
   3.3. මනෝ විද්‍යාත්මක වැඩමුළු පැවැත්වීම
   3.4. වෛද්‍ය ආධාර ලබාදීම
   3.5. වෛද්‍ය ණය ලබාදීම

04. අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සැලසීම ........ 20 - 25
   4.1. රණවිරු දූ දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව ක්‍රමය
   4.2. අ.පො.ස උ. පෙළ ශිෂ්‍යත්ව ක්‍රමය
   4.3. උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර
   4.4. මාපිය කැපකරු ශිෂ්‍යත්ව
   4.5. අධ්‍යාපන වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා අර්ධ ශිෂ්‍යත්ව
   4.6. දේශීය, විදේශීය ක්‍රීඩා තරඟ හා අධ්‍යාපන කටයුතු වලට සහභාගිවීම වෙනුවෙන් ආධාර
   4.7. කුසලතා සංවර්ධන ණය

05. ඵලදායී සේවානියුක්තියක් සුරක්ෂිත කිරිමෙහි ලා සහාය වීම ........ 26 - 30
   5.1. ස්වයං රැකියා ණය ලබා දීම
   5.2. ස්වයං රැකියා ආධාර ලබා දීම
   5.3. පුහුණු වැඩමුළු පැවැත්වීම

06. අධිකාරියේ කර්තව්‍යන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු දෑ කිරීම ……. 31 - 40

6.1. රණවිරු මාපිය සුරැකුම් වැඩසටහන
6.2. රණවිරු මාපිය රැකවරණ ප්‍රතිලාභ
6.3. රණවිරු සංසද දිස්ත්‍රික් දැනුවත් කිරිම
6.4. රණවිරු අනුස්මරණ ව්‍යාපෘතිය
6.5. මයිලපිටිය උද්‍යානයේ නඩත්තු හා සංවර්ධන කටයුතු
6.6. යාකබැද්ද - රණවිරු වැඩිහිටි සුරක්ෂා මැදුර සහ සම්පත් මධ්‍යස්ථානය
6.7. “ විරුසර ” වරප්‍රසාද කාඩ්පත
6.8. රණවිරු සුවඳ සාහිත්‍ය උත්සවය
6.9. රණවිරු කාන්තා හා ළමා සංවර්ධන ඒකකය
6.10. ක්‍රීඩා අංශය
6.11. රණවිරු ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරිම

විගණකාධිපති වාර්තාව........................................................................................................ 41

අවසාන ගිණුම් ප්‍රකාශය ..................................................................................................... 53

වාර්ෂික වාර්තාව - 2017 දෙමළ පරිවර්තනය

වාර්ෂික වාර්තාව - 2017 ඉංග්‍රීසී පරිවර්තනය

# රණවිරු සේවා අධිකාරිය

ගෝත්‍රික ජන සමාජයේ ගෝත්‍ර නායකයා රජු බවට පත් වීමත් සමඟම ගෝත්‍රයට අනන්‍ය වූ බිම් රැකීම සඳහා ශරීර ශක්තියෙන් අනූනයන් භූමිය ආරක්ෂාව සඳහා යෙදවීම යනු මානව ශිෂ්ටාචාරයේ ආරක්ෂක සේවයේ මූලාරම්භයයි. ශිෂ්ටාචාරය නොයෙකුත් කාලීන ප්‍රවණතා සමඟ පරිපාකයට පත්වීමත් සමඟ සම්මත නීතියකට සහ විනයකට අනුව ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක වර්ධනයක් ආරක්ෂක සේවයේ ද දකින්නට ලැබුණි.

වෘත්තියට සහ ඉපයීමට පමණක් සීමා නොවූ ආරක්ෂක වෘත්තියේ වෘත්තිකත්වය දිවි හිමියෙන් කටයුතු කිරීම නිසා උත්තරීතරත්වයට පත් වෙන ලදී. එබැවින් ආරක්ෂක සේවය වනාහි ලෝකයේ සෑම රටකම ජනතාවගේ ගෞරවාදරයට පත් වූ උතුම් වෘත්තියකි.

ඓතිහාසික යුගයේ සිට මෙරටට එල්ල වූ ආක්‍රමණ හමුවේ මෙන්ම අභ්‍යන්තර සිවිල් අරගල හමුවේ රජු, සේනාපති ප්‍රමුඛ ඒ ඒ සේනාංක විසින් ඉටු කරන්නා වූ රණවිරු මෙහෙය 1972 ජනරජයක් බවට පත් වූ ශ්‍රී ලංකාව තුල ද ආරක්ෂක සේවය කාලීන වෙනස්කම් වලට භාජනය වෙමින් අද්‍යකාලීන තත්ත්වය දක්වා ඔපමට්ටම් වී සැකසී ඇත. ලාංකීය ඉතිහාසය තුළ දරුණුතම ත්‍රස්තවාදයට මුහුණදුන් වීර පරපුරක වර්තමාන හැඩය ඉස්මතු කොට යුද්ධය අවසන් කළ ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ රණවිරුවන් රටේ ගෞරවය හා පෞර්ෂය රණවිරුවන් බව ප්‍රත්‍යක්ෂ කර ඇත.

ක්‍රියාන්විතයේ දී ශරීරාංග අහිමි ව සිටින ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ රණවිරුවන් සහ ක්‍රියාන්විතයේ දී දිවි පිදූ හෝ සොයා ගත නොහැකිව සිටින ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ රණවිරුවන්ගේ යැපෙන්නන්ගේ පුනරුත්තාපනය, රැකබලාගැනීම, සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂාංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස 1999 අංක 54 දරණ පාර්ලිමේන්තු පනතින් රණවිරු සේවා අධිකාරිය ස්ථාපිත කර ඇත.

# අපේ දැක්ම....

**රණවිරු නාමයට ජාතියේ කෘතගුණ දැක්වීම.**

# අපේ මෙහෙවර....

**ශ්‍රී ලාංකාවේ ඒකීය භාවය සුරක්ෂිත කරනු පිණිස ජීවිත පූද කළා වූ අතුරුදහන් වූ හා ආබාධිත වූ රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ මානසික හා සාමාජීය ස්ථාවරභාවයක් ඇති කිරීම මෙන්ම සේවයේ නියුතු රණවිරුවන් සහ එම පවුල් වල මානසික ප්‍රබෝධයක් ඇති වන අයුරින් ක්‍රියා කිරීම.**

# රණවිරු සේවා අධිකාරියේ කර්තව්‍ය

(අ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත් ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ පසු උවටැන සහ, ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ආ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට;

නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම ;

(ඇ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට

වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම ;

(ඈ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට,

ශිෂ්‍යත්ව සහ වෙනත් ආකාරයේ උපකාර ලබා දීමෙන් ඔවුන්ට අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබාගැනීමට අවස්ථාව සලසා දීම ;

(ඉ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට ; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය සහ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට,

ඵලදායී සේවා නියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහාය වීම ;

(ඊ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සේවා නියුක්තිය සැලසීමේ අරමුණු ඇතිව කාර්මික, කෘෂිකාර්මික හෝ වානිජ ව්‍යවසායයන් පිහිටුවීම; සහ

(උ) අධිකාරියේ කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු ක්‍රියා හා දේ කිරිම.

# සභාපතිතුමියගේ පණිවුඩය...



දේශයට ආරක්ෂාවක්, සාමයක් ලඟාකරදීමට දශක තුනකට ආසන්න කාලයක් ත්‍රස්තවාදීන් සමඟ සටන් කළ ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවයේ යෙදී සිට ජීවිත පරිත්‍යාග කළ රණවිරු පවුල් වල සාමාජික සාමාජිකාවන් සහ ශරීරාංග පරිත්‍යාග කල රණවිරුවන් පුනරුත්තාපනය කොට රැකබලා ගනිමින් ඔවුන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීමට අවශ්‍ය මනෝ සාමාජීය, ආර්ථික, අධ්‍යාපනික මෙන්ම අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කරලීමේ කර්තව්‍යය 1999 අංක 54 දරන පනතින් ස්ථාපිත කරන ලද රණවිරු සේවා අධිකාරියට පැවරී ඇත.

2015 වර්ෂයෙන් ආරම්භ කරන ලද නව උපායමාර්ගික සැලසුමක තෙවන වර්ෂය වූ 2017 වර්ෂයේදී ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රුවන් විජයවර්ධන මැතිතුමාගේ මඟපෙන්වීමෙන් ගරු නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ සහයෝගයෙන් ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය,රණවිරු සේවා අධිකාරිය, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා ඒකාබද්ධව රු.මි. 3192 ක මුදලක් වැයකරමින් වසර 4 ක කාලයක් තුළ නිවාස 3650 ක් ඉදිකර අවසන් කිරීමට සැලසුම් කර ඇති " විරුසුමිතුරු " ජාතික නිවාස ව්‍යාපෘති වැඩසටහන ආරම්භකර ක්‍රියාත්මක කිරීමට හැකිවීම රණවිරු සුභසාධන ක්‍රියාවලියේ සුවිශේෂී සන්ධිස්ථානයකි.

එමෙන්ම, වාර්ෂිකව පවත්වාගෙන ආ රණවිරු සුභසාධන වැඩසටහන්ද තවදුරටත් පවත්වාගෙන යමින් රණවිරු ප්‍රජාව වෙනුවෙන් ප්‍රසංශනීය සේවාවක් ඉටුකිරීමටද රණවිරු සේවා අධිකාරිය වශයෙන් අපට හැකියාවක් ලැබී ඇත. ඊට නිරතුරුව සහාය ලබාදෙන ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමා ප්‍රමුඛ කාර්යමණ්ඩලයටද, රණවිරු සේවා අධිකාරියේ උප සභාපතිතුමිය,අධ්‍යක්ෂතුමා ප්‍රමුඛ කාර්යය මණ්ඩලයේ සියළුම සාමාජික සාමාජිකාවන්ටත් අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමි.

2018 වර්ෂයේ රණවිරු සේවා අධිකාරියේ කටයුතු සාර්ථක කර ගැනීමටද සියළු දෙනාගේ සහයෝගය කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් අපේක්ෂා කරමි.

අනෝමා ෆොන්සේකා
සභාපතිනි
රණවිරු සේවා අධිකාරිය

# ආයතනික අධ්‍යක්ෂ මණ්ඩලය

1. **අනෝමා ෆොන්සේකා මහත්මිය**
   සභාපතිනි, රණවිරු සේවා අධිකාරිය

2. **උපුලාංගනී මාලගමුව මහත්මිය**
   උප සභාපතිනි, රණවිරු සේවා අධිකාරිය

3. **අයි.ටී. වීරසිංහ මෙනවිය**
   අතිරේක ලේකම්, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය

4. **වයි.පී. සුමනාවති මහත්මිය**
   අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව

5. **මේජර් ජෙනරාල් කේ.ඒ.ඩී.ඒ. කරුණාසේකර මහතා**
   මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද හමුදාව

6. **රියර් අද්මිරාල් එන්.බී.ජේ. රොසයිරෝ මහතා**
   මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා නාවික හමුදාව

7. **එයාර් වයිස් මාර්ෂල් ඩී.එල්.එස්. ඩයස් මහතා**
   අධ්‍යක්ෂ සුබ සාධක, ශ්‍රී ලංකා ගුවන් හමුදාව

8. **එම්.ඩී. රජිත ශ්‍රී දමින්ද මහතා**
   නියෝජ්‍ය පොලිස්පති සුබ සාධක, ශ්‍රී ලංකා පොලිසිය

9. **මේජර් ජනරාල් ඩී.එම්.ඩී අල්විස් මහතා**
   කළමනාකරණ මණ්ඩල සාමාජික

10. **ජී.පී.නිල්මිණි පෙරේරා මහත්මිය**
    කළමනාකරණ මණ්ඩල සාමාජික

11. **ඩබ්.පී.නිමල් ප්‍රනාන්දු මහතා**
    කළමනාකරණ මණ්ඩල සාමාජික

# අපගේ ක්‍රියාත්මක ව්‍යාපෘති

# - 01 -

# ආබාධිත රණවිරු පසු උවටැන සහ පුනරුත්ථාපනය

රණවිරු සේවා අධිකාරියේ පනතින් පැවරී ඇති ආබාධිත රණවිරුවන්ගේ ආබාධිත තත්ත්වයන් හේතුවෙන් ඔවුන් මුහුණපාන අපහසුතා මගහරවාලීම සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඉටු කිරීම වෙනුවෙන් පහත වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

1.1. ආබාධිත උපකරණ ලබා දීම.
1.2. සනීපාරක්ෂක ආධාර ලබා දීම.
1.3. ආබාධිත රණවිරු පුහුණු වැඩමුළු පැවැත්වීම.

## 1.1. ආබාධිත උපකරණ ලබා දීම



ආබාධිත විශ්‍රාමික රණවිරුවා යනු සාමාන්‍ය පුද්ගලයෙකුට වඩා සුවිශේෂී අයෙක් වන අතර ඔවුන්ගේ ආබාධිත බව අභිබවා දෛනික ජීවිතය ගැටලුවකින් තොරව පවත්වාගෙන යාමට නොයෙක් ආකාරයේ සහායන් අත්‍යවශ්‍ය වන අතර ඉන් ප්‍රධානම වන්නේ ආධාරක උපකරණ ලබාදීමයි.

ඒ අනුව, ආබාධිත විශ්‍රාමික රණවිරුවන් වෙනුවෙන් රණවිරු සේවා අධිකාරිය විසින් 2017 වර්ෂයේදී පහත පරිදි ආධාරක උපකරණ ලබා දී ඇත.

| අංක | ආධාරක උපකරණය | ප්‍රමාණය |
|---|---|---|
| 01. | අත්වාරු (යුගල් ) | 200 |
| 02. | කිහිලිකරු ( යුගල් ) | 16 |
| 03. | රෝද පුටු ( සාමාන්‍ය ) | 120 |
| 04. | රෝද පුටු ( කොමඩ් ) | 24 |
| 05. | ත්‍රයිසිකල් | 10 |
| 06. | කෘත්‍රිම පාද | 158 |
| 07. | මුත්‍රා බෑග් | ප්‍රතිලාභීන් 03 ක් සඳහා |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

## 1.2. සනීපාරක්ෂක ආධාර ලබා දීම

විවිධ කායික රෝගාබාධයන්ට ගොදුරු වූ පුද්ගලයන්ට සනීපාරක්ෂක පහසුකම් සැලසීමේදී ඔවුන්ගේ ආබාධිත තත්ත්වයන්ට ගැලපෙන ආකාරයේ වැසිකිලි, ජල කරාම, ප්‍රවේශ මාර්ග, ආධාරක සහ ජල සැපයුම් ආදිය සපයා දීම එම පුද්ගලයින්ට පමණක් නොව ඔවුන් රැකබලාගන්නන්ට ද පහසුවක් වේ.

ඒ අනුව මෙම කායික අපහසුතාවයන්ට හා රෝග තත්ත්වයන්ට ලක්වී පීඩා විඳින ආබාධිත විශ්‍රාමික රණවිරුවන් සඳහා ගැලපෙන ආකාරයේ සනීපාරක්ෂක පහසුකම් සපයා ගැනීමට සහාය වීම මෙහි අරමුණු වේ.

මෙම ආධාර ක්‍රමය යටතේ රු. 50,000.00 ක ආධාර මුදලක් ලබා දෙන අතර 2017 වර්ෂයේ ප්‍රතිලාභීන් 58 දෙනෙකු සඳහා ප්‍රතිලාභ හිමි කර දී ඇත.

## 1.3. ආබාධිත රණවිරු පුහුණු වැඩමුළු



යුධ ගැටුම්වලට මැදිවීම හේතුකොටගෙන ආබාධිත වූ රණවිරුවන් පසුකාලීනව සිය ආබාධිත තත්ත්වයන් මත කායිකව හා මානසිකව විවිධ රෝගාබාධයන්ට ලක්වේ. අන්තර් පුද්ගල සබඳතා අවම වීම, ඒකාකාරී ජීවන රටාවකට සිරවීම නිසා ව්‍යාකූල තත්වයන් උද්ගත වන අතර රණවිරුවන් මෙවැනි ව්‍යාකූල වීම හේතුවෙන් දෛනික කටයුතු පවත්වාගෙන යාමේදී රණවිරුවා මෙන්ම පවුලේ සාමාජිකයින්ද පීඩනයට පත්වේ.

ආබාධිත විශ්‍රාමික රණවිරුවන් මුහුණදෙන ගැටළු හඳුනාගෙන ඉන් මිදීම සඳහා සහයවීමත්, ඔවුන් කායිකව හා මානසිකව සවිබල ගැන්වීමත් මෙම වැඩසටහන මඟින් සිදු කරනු ලබන අතර මෙම වැඩමුළු පැවැත්වීමේ අරමුණු පහත පරිදි වේ.

- ආබාධිත රණවිරුවන් මුහුණ දී තිබෙන හා ඉදිරියේදී ඔවුනට ඇතිවිය හැකි සෞඛ්‍ය ගැටළු හඳුනාගෙන ඊට පිළියම් යෙදීම හා එම ගැටළු ඇතිවීම වළක්වා ගැනීමේ දැනුම ලබාදීම.
- නවීන ප්‍රතිකාර ක්‍රම, සහයක උපකරණ ආදිය පිළිබඳව දැනුවත් කිරීම.
- යහපත් ජීවිතයක් සඳහා මනෝවිද්‍යාත්මක මඟපෙන්වීම ලබාදීම.
- ආබාධිත රණවිරුවන් අතර අනෝන්‍ය සුහදතා වර්ධනයට ඉඩකඩක් ලබාදීම.
- රණවිරුවන්ගේ සංස්කෘතික දක්ෂතා ප්‍රකට කරලීමට හා ඒවා ඇගයීමට අවස්ථාව ලබාදීම.
- ආබාධිත රණවිරුවන් වෙත රණවිරු සේවා අධිකාරිය මඟින් ලබා දෙන සේවා ලබාදීමට සුදුසු පුද්ගලයන් හඳුනාගෙන ඒවා කඩිනමින් ලබාදීමේ සම්බන්ධීකරණය ඇතිකර ගැනීම.

ඒ අනුව, 2017 වර්ෂයේ ආබාධිත රණවිරුවන් වෙනුවෙන් පහත සඳහන් දිනයන්හිදි පුහුණු වැඩමුළු 04 ක් පවත්වා ඇත.

| | දිනය | ස්ථානය | සහභාගී වූ ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | 2017.11.20 හා 21 | බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය | **108**<br>(කුරුණෑගල දිස්ත්‍රික් රණවිරුවන් ) |
| 02. | 2017.11.25 හා 26 | බලංගොඩ, සමනළ වැව සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය | **62**<br>(බදුල්ල/ මොණරාගල දිස්ත්‍රික් රණවිරුවන් ) |
| 03. | 2017.12.11 හා 12 | වක්වැල්ල කළමනාකරණ සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය | **44**<br>(ගාල්ල/ මාතර දිස්ත්‍රික් රණවිරුවන් ) |
| 04. | 2017.12.18 හා 19 | බලංගොඩ, සමනළ වැව සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය | **62**<br>(රත්නපුර/ කෑගල්ල දිස්ත්‍රික් රණවිරුවන් ) |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

ආබාධිත රණවිරු පසු උවටැන සහ පුනරුත්ථාපනය වෙනුවෙන් රණවිරු සේවා අධිකාරිය විසින් 2017 වර්ෂය තුල ළඟා වී ඇති ප්‍රගතිය පහත පරිදි වේ.

| ආබාධිත රණවිරු පසු උවටැන සහ පුනරුත්ථාපනය | භෞතික | | මූල්‍ය (රු.මි ) | |
|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | වෙන්කිරීම | ප්‍රගතිය |
| ආබාධිත උපකරණ | 731 | 731 | 11.29 | 9.52 |
| සනීපාරක්ෂක ආධාර - නව | 100 | 58 | 5.00 | 2.20 |
| සනීපාරක්ෂක ආධාර - පැරණි | 73 | 46 | | |
| ආබාධිත වැඩමුළු පැවැත්වීම | 04 | 04 | 1.50 | 0.85 |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )




( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

# - 02 -

## රණවිරු නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම

ක්‍රියාන්විතයේදී ආබාධිත රණවිරුවන් සඳහා සහ මියගිය හෝ සොයාගත නොහැකි රණවිරුවන්ගේ යැපෙන්නන්ට රණවිරු සේවා අධිකාරියේ පනතින් පැවරි ඇති කර්තව්‍ය යටතේ නිවාස සැපයීම හා එහිලා සහාය වීම වෙනුවෙන් පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

2.1. විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය.
2.2. නිවාස ණය ලබා දීම.
2.3. හදිසි ආපදාවන්හිදි මුල්‍යාධාර ලබාදීම.
2.4. ඉඩම් ලබා දීම.

## 2.1. විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය




නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය යටතේ රණවිරු සේවා අධිකාරිය ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන " විරුසුමිතුරු " ජාතික නිවාස ව්‍යාපෘති වැඩසටහන 2017 වර්ෂයෙන් ආරම්භව 2020 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමට නියමිත ය.

ක්‍රියාන්විත රාජකාරියේදී ත්‍රස්තවාදී ප්‍රහාර වලට ලක්ව දිවිපිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් සහ ක්‍රියාන්විත රාජකාරියේදී ත්‍රස්තවාදී ප්‍රහාර වලට ලක්ව ආබාධිත තත්ත්වයට පත්ව ඒ නිසාම විශ්‍රාම තත්ත්වයට පත්වූ ආබාධිත විශ්‍රාමික රණවිරුවන්ගේ නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම පෙරදැරි කරගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය මඟින් 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වසර 4 ක කාලයක් තුළ නිවාස 3650 ක් ඉදිකර අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර ව්‍යාපෘතියේ සමස්ථ පිරිවැය රු.මි. 3192 කි. මෙම මුදල නිවාස සංවර්ධන අධිකාරිය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලැබීමට නියමිත අතර, එයින් 2017 වර්ෂය සඳහා රු.මි. 798 ක ප්‍රතිපාදන වෙන් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව එක් වර්ෂයක් තුළ පූර්ණ නිවාස 488 ක් සඳහා එක් නිවසකට රු.මි. 1.2 ක් ද අර්ධ නිවාස 425 ක් සඳහා එක් නිවසකට උපරිමය රු.මි. 0.5 ක් බැගින් ද ප්‍රතිලාභීන් හට ලබා දීමට කටයුතු කරයි. ඒ අනුව 2017 වර්ෂය තුල විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත පරිදි වේ.

- 2017 වර්ෂයේ මුල් කාර්තුවේදී ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදි.

- 2017.07.05 වන දින අරලියගහ මන්දිරයේ දී විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතියේ සමාරම්භය සනිටුහන් කරමින් අතිගරු ජනාධිපතිතුමාගේ සුරතින් ප්‍රථම අදියර යටතේ නිවාස ප්‍රතිලාභීන් සඳහා ප්‍රේෂණපත් ලබා දෙන ලදී.
- තවද ප්‍රතිලාභීන්ගේ සුදුසුකම් මත තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ රණවිරු සේවා අධිකාරියේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේත්, රණවිරු සේවා අධිකාරියේ නිලධාරීන්ගෙනුත්, ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන්ගෙනුත් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයන් මගින් පවත්වන ලදී.
- ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභීත්වය සඳහා තෝරා ගත් මුළු අර්ධ හා පූර්ණ නිවාස පිළිබඳ දත්ත පහත පරිදි වේ.

| ප්‍රතිලාභීත්වය ලබා දුන් දිනය | නිවාස ගණන | යුධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව | පොලිසිය | සිවිල් ආරක්ෂක |
|---|---|---|---|---|---|---|
| 2017.07.05 | 193 | 117 | 15 | 07 | 36 | 08 |
| 2017.10.02 | 25 | 24 | - | - | 01 | - |
| 2017.10.09 | 36 | 31 | 03 | 01 | 01 | - |
| 2017.10.31 දින වන විට | 09 | 07 | 02 | - | - | - |
| **එකතුව** | **263** | **179** | **20** | **08** | **38** | **08** |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

**ඉදිකිරීම් කටයුතු සිදු කරන නිවාස බෙදී යාම. ( දිස්ත්‍රික්ක වශයෙන් )**

| දිස්ත්‍රික්කය | පූර්ණ නිවාස | අර්ධ නිවාස | එකතුව |
|---|---|---|---|
| අනුරාධපුරය | 11 | - | 11 |
| පොළොන්නරුව | 01 | - | 01 |
| කොළඹ | 03 | - | 03 |
| ගම්පහ | 04 | - | 04 |
| කළුතර | 05 | - | 05 |
| ගාල්ල | 10 | - | 10 |
| මාතර | 09 | 21 | 30 |
| හම්බන්තොට | 09 | 31 | 40 |
| කෑගල්ල | 09 | - | 09 |
| රත්නපුරය | 14 | - | 14 |
| මහනුවර | 11 | - | 11 |
| මාතලේ | 06 | - | 06 |
| නුවරඑළිය | 05 | - | 05 |
| කුරුණෑගල | 14 | - | 14 |
| පුත්තලම | 06 | - | 06 |
| බදුල්ල | 03 | - | 03 |
| මොණරාගල | 04 | - | 04 |
| ත්‍රිකුණාමලය | 14 | - | 14 |
| අම්පාර | 08 | - | 08 |
| මඩකලපුව | 39 | - | 39 |
| වව්නියාව | 06 | - | 06 |
| **එකතුව** | **191** | **52** | **243** |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

## 2.2. සංසද හා ගම්මාන සඳහා නිවාස ණය ලබා දීම



රණවිරු සංසද හා ගම්මානවල සිටින රණවිරු පවුල්වල සාමාජික සාමාජිකාවන්ගේ නිවසක් ගොඩනගා ගැනිමේ සිහිනය සැබෑ කිරිමේ අරමුණින් යුතුව රණවිරු සේවා අධිකාරිය විසින් නිවාස ණය ලබා දීම සිදු කෙරේ. ක්‍රියාන්විතයේදී ජීවිතය පුදකළ , අතුරුදහන් රණවිරුවන්ගේ ළඟම ඥාතීන් හා ක්‍රියාන්විතයේදී ආබාධිත විශ්‍රාමික රණවිරුවන් මෙම ප්‍රතිලාභය ලබා ගත හැකි පාර්ශවයන් වේ.

මෙමඟින් රු. 300,000.00 ක ණය මුදලක් ලබා දෙන අතර එය වාරික 02 ක් ලෙස ලබා දීම සිදු කරයි. එය අයකර ගැනීමේ කාලය උපරිම වසර 04 ක් වන අතර 5% ක සේවා ගාස්තුවක් මත මෙම ණය මුදල ලබා දෙනු ලැබේ. ඒ අනුව 2017 වර්ෂයේ දී නිවාස ණය 28 ක් ලබා දී ඇති අතර එය දිස්ත්‍රික් අනුව බෙදී ගිය ආකාරය පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| අනුරාධපුරය | 06 |
| පොළොන්නරුව | 01 |
| මහනුවර | 03 |
| ගම්පහ | 02 |
| කොළඹ | 05 |
| කළුතර | 03 |
| කෑගල්ල | 01 |
| රත්නපුර | 01 |
| බදුල්ල | 01 |
| කුරුණෑගල | 05 |
| **එකතුව** | **28** |

( මුලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

## 2.3. හදිසි ආපදාවන්හිදී මූල්‍ය ආධාර ලබා දීම

රණවිරු සංසද සාමාජිකත්වයේ හෝ සේවයේ යෙදී සිටින ආබාධිත රණවිරුවන්ගේ ඇතිවන නාය යෑම්, සුළි සුළං, ගිණිගැනීම් හා ජල ගැලීම් වැනි හදිසි ආපදා තත්ත්වයකදී ඔවුන්ට සිදුවන අලාභ හානි සැලකිල්ලට ගෙන එම රණවිරු පවුල් වෙත අස්වැසිල්ලක් වන අරමුණෙන් රු. 25,000.00 ක මුදල් කඩිනමින් ලබා දී රණවිරු පවුල් වෙත මූල්‍ය සහනයක් ලබා දීම මෙමඟින් සිදු කරයි.

2017 වර්ෂයේ දි හදිසි ආපදා ආධාර ප්‍රතිලාභීන් 18 දෙනෙකු වෙත බෙදා දී තිබේ.

## 2.4. ඉඩම් ලබා දීම

රණවිරු සේවා අධිකාරියේ කාර්යභාරය රණවිරුවන් හා එම පවුල් සඳහා ඉටුකිරිමේදී වඩාත් විශේෂ වූ හා සංකීර්ණ වූ අංශයක් ලෙස අදාල පවුල් සඳහා වාසස්ථානයක් සපයාදීම දැක්විය හැකිය. එහෙත් බොහෝ විට නිවාස හා සහන ණය ව්‍යාපෘතීන් මාර්ගයෙන් අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා පදිංචියට නිවසක් සඳහා දිරිදුන්න ද එම නිවාස ගොඩනැඟීම සඳහා ස්ථානයක් ( ඉඩමක් ) හිමිව නැති අවස්ථාවන් වලදී රණවිරුවා හා එම පවුල් මහත් අසීරුතාවයකට පත්වේ.

එයට විසඳුමක් ලෙස ඉඩම් ව්‍යාපෘතිය මඟින් සෘජුවම ඉඩම් කැබලි ලබා දීම හා වක්‍රව ඉඩම් ලබා ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම සිදු කෙරේ. ඒ අනුව පහත පරිදි 2017 වර්ෂයේ ඉඩම් ව්‍යාපෘතියේ ප්‍රගතිය දැක්විය හැකි ය.

- **ඉඩම් කොටස් ලබාදීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම**

| කාර්යය | ඉඩම් ප්‍රමාණය | අදාල ආයතනය |
|---|---|---|
| ආණමඩුව | 04 | |
| කලවාන | 04 | |
| මහනුවර | 01 | |
| බේරුවල | 01 | |
| ඉබ්බාගමුව | 02 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| අක්මීමන | 01 | |
| ඇකිරිය | 01 | |
| දිගම්පතන | 01 | |
| මීරිගම | 03 | |
| පුත්තලම | 01 | |
| කෑගල්ල | 01 | |
| වැල්ලවාය | 01 | |
| බදුරලිය | 01 | |
| පන්විල | 01 | ශ්‍රී ලංකා වතු සංවර්ධන මණ්ඩලය |
| කොළඹ | 01 | |
| කෑගල්ල | 01 | දිස්ත්‍රික් කාර්යාලය |
| දිගන | 01 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| පල්ලේකැලේ | 01 | |
| මොරගහකන්ද | 01 | |
| මයුරපුර | 01 | |
| ගම්පොල | 01 | |
| දෙහිඅත්තකණ්ඩිය | 01 | |
| මොණරාගල | 01 | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව |
| **මුළු එකතුව** | **32** | |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

- **රජයේ ඉඩම් සඳහා ඔප්පු/ බලපත්‍ර ලබා දීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරිම**

| කාර්යය | ප්‍රමාණය | සටහන්/ අදාල ආයතන |
|---|---|---|
| රණවිරුවන්ගේ ඉල්ලීම් වලට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් යොමු කර ඇති ලිපි වලට අදාලව අනවසරයෙන් පදිංචි වී ඇති ඉඩම් සඳහා ඔප්පු/ බලපත්‍ර ලබා ගැනීමට අදාල නිර්දේශ ඉදිරිපත් කිරීම.<br><br>( ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2005.03.03 වන දින 4/10/ චක්‍රලේඛය, 2005/03 දරණ චක්‍රලේඛය සහ 2016/07 චක්‍රලේඛයට අනුව ) | 654 | ඉඩම් කොමසාරිස් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මහවැලි අධිකාරිය, ඉඩම් ප්‍රතිසංස්කරණ කාර්යාලය |
| ඉඩම් කච්චේරි පැවැත්වීම | 04 | ආණමඩුව, බඩල්කුඹුර, පදවිය, මහියංගණය ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

- **හඳුනාගත් ඉඩම් සඳහා නාම ලේඛණ ඉදිරිපත් කිරීම**

| කාර්යය | ඉඩම් ප්‍රමාණය | අදාල ආයතනය |
|---|---|---|
| පදවිය | 98 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත |
| මහවිලච්චිය | 91 | |
| ගල්ගමුව | 148 | |
| හඟුරන්කෙත | 32 | |
| වලපනේ | 39 | |
| මඩකලපුව | 09 | |
| බඩල්කුඹුර | 50 | |
| මුන්දලම | 04 | |
| මහියංගණය | 06 | |
| දඹුල්ල | 15 | |
| අගුණකොලපැලැස්ස | 05 | |
| අක්මීමන | 50 | |
| **මුළු එකතුව** | **547** | |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

රණවිරු නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම් වෙනුවෙන් 2017 වර්ෂයේ දී ඉලක්ක කරා ලඟා වීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

| රණවිරු නිවාස සැපයීම | 2017භෞතික | | 2017 මූල්‍ය (රු. මි) | |
|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | වෙන්කිරීම | ප්‍රගතිය |
| සංසද නිවාස ණය - නව | 30 | 28 | 13.20 | 12.54 |
| සංසද නිවාස ණය - පැරණි | 23 | 23 | | |
| හදිසි ආපදාවන්හි දී මූල්‍ය ආධාර | 150 | 18 | 3.75 | 0.69 |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )




( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

# - 03 -

# වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම.

ආබාධිත රණවිරුවන්, ඔවුන්ගේ පවුල් වල ළඟම ඥාතීන් හා දිවි පිදූ, අතුරුදහන් රණවිරුවන්ගේ ළඟම ඥාතීන් කායික හා මානසික වශයෙන් සවිබල ගැන්වීම සඳහා රණවිරු සේවා අධිකාරියේ පනතින් පැවරී ඇති කර්තව්‍යක් ලෙස වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම යන කරුණ සඳහන් කල හැකිය. ඒ අනුව එය ඉටු කිරීම සඳහා පහත ව්‍යාපෘති හා වැඩසටහන් රණවිරු සේවා අධිකාරිය විසින් සිදු කරනු ලබයි.

3.1. වෛද්‍ය සායන පැවැත්වීම
3.2. සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩමුළු පැවැත්වීම
3.3. මනෝ විද්‍යාත්මක වැඩමුළු පැවැත්වීම
3.4. වෛද්‍ය ආධාර ලබාදීම
3.5. වෛද්‍ය ණය ලබාදීම

## 3.1. වෛද්‍ය සායන පැවැත්වීම



දිවයින පුරා විසිරී සිටින රණවිරු සංසද සාමාජික අබාධිත විශ්‍රාමික රණවිරුවන් ඔවුන්ගේ පවුල් ඥාතීන් හා මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ගේ සෞඛ්‍ය මට්ටම යහපත් කිරීම වෙනුවෙන් පවත්වනු ලබන වෛද්‍ය සායන පහත සඳහන් අරමුණු මූලික කරගෙන ක්‍රියාත්මක කරනු ලබයි.

- රෝග කාරක තත්වයන් කල්තබා හඳුනාගැනීම.
- පවතින රෝග තත්වයන් වැඩි දියුණු වීම වළක්වා ගැනීම සඳහා ප්‍රතිකාර ලබා දීම.
- සෞඛ්‍ය පිළිබඳව ඇති අවබෝධය වර්ධනය කිරීම.
- විධිමත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරන්නා වූ නිරෝගී රණවිරු ප්‍රජාවක් බිහිකර ගැනීම.

ඒ අනුව, 2017 වර්ෂය තුල රණවිරු ප්‍රජාව සඳහා පහත පරිදි වෛද්‍ය සායන පවත්වා ඇත.

| අනු අංක | සායනය පැවැත් වූ ස්ථානය | සායනය පැවැත් වූ දිනය | සායනය සඳහා සහභාගී වූ ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 2017.01.09 | 227 |
| 02 | ත්‍රිකුණාමලය නගර ශාලා පරිශ්‍රය | 2017.06.05 | 128 |
| 03 | බණ්ඩාරවෙල නගර ශාලා පරිශ්‍රය | 2017.06.23 | 280 |
| 04 | ගැටඹේ සුධර්මාරාම විහාරස්ථානය | 2017.07.12 | 128 |
| 05 | මොණරාගල පුස්තකාල ශ්‍රවණාගාරය | 2017.08.24 | 87 |
| 06 | හොරොව්පතාන ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය | 2017.09.12 | 713 |
| 07 | වාරියපොල නගර ශාලාව | 2017.10.11 | 225 |
| 08 | ලුණුගම්වෙහෙර රජ මහා විහාරය | 2017.10.19 | 221 |
| 09 | ඇතගම සුමනාරාම මහා විහාරය | 2017.10.25 | 130 |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

## 3.2. සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩමුලු පැවැත්වීම



අබාධිත විශ්‍රාමික රණවිරුවන් ඔවුන්ගේ පවුල් ඥාතීන් හා මියගිය රණවිරුවන්ගේ ළගම ඥාතීන්ගේ සෞඛ්‍ය ගැටලු අධ්‍යනය කිරීමේදී ඔවුන්ගේ සෞඛ්‍ය දුර්වලවීම සඳහා සෘජු දායකත්වයක් ඔවුන් ගන්නා ආහාර හා ඇවතුම් පැවතුම් වල ඇති වැරදි භාවිතාව නිසා සිදුවන බව පෙනී ගොස් ඇත.

එම ගැටළු සඳහා පිළියමක් ලෙස ඔවුන් හට සෞඛ්‍ය හා පෝෂණය පිළිබඳ දැනුමක් ලබා දීම සඳහා පහත සඳහන් කරුණු අරමුණු කරගෙන සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩමුලු පවත්වනු ලබයි.

- පුද්ගලයන් අනුගමනය කරන දුෂ්පෝෂණ රටා පෙන්වා දීම හා ඒවායේ අහිතකර බලපෑම වටහා දීම.
- දේශීය ආහාර හා ඒවායේ පෝෂණය ගැන අවබෝධයක් ලබා දීම.
- විවිධත්වයකින් යුතුව ගුණාත්මක බව සුරකෙන අයුරින් ආහාර සකස් කර ගැනීමට මඟ පෙන්වීම.
- දේශීය අමුද්‍රව්‍ය ඇසුරින් රුව රැකගැනීමේ ප්‍රතිකාර සම්බන්ධව කාන්තාවන් දැනුවත් කිරීම.

ඒ අනුව 2017 වර්ෂයේ දී පැවැත්වූ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩමුළු පහත සඳහන් පරිදි වේ.

| අනු අංක | වැඩමුළුව පැවැත් වූ ස්ථානය | වැඩමුළුව පැවැත් වූ දිනය | වැඩමුළුව සඳහා සහභාගී වූ ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | හලාවත සුදසුන ශාලාව | 2017.06.13 | 16 |
| 02 | බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2017.06.14 | 49 |
| 03 | වලපනේ ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය | 2017.06.29 | 111 |
| 04 | අම්පාර නගර ශාලාව | 2017.07.13 | 87 |
| 05 | නාගොඩ විජිතාරාම විහාරය | 2017.08.08 | 53 |
| 06 | අකුරැස්ස ගංගාරාම විහාරය | 2017.08.09 | 97 |
| 07 | තිස්සමහාරාමය මැණික් රජ මහා විහාරය | 2017.08.10 | 46 |
| 08 | සුමනකීර්ති බෝධිරුක්ඛාරාම පිරිවෙන විහාරය | 2017.10.07 | 73 |
| 09 | අඹන්පිටිය ශ්‍රී සුවිසුද්ධාරාම මහා විහාරය | 2017.11.23 | 108 |
| 10 | හිඳැල්ලන වීරගොඩ ශ්‍රී මහා විහාරය | 2017.11.30 | 46 |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

## 3.3. මනෝ විද්‍යාත්මක වැඩමුලු පැවැත්වීම



ආබාධිත රණවිරුවන් හා රණවිරු පවුල් සාමාජිකයින්ට සුවිශේෂී ප්‍රශ්න නිරාකරණය සඳහා අවශ්‍ය මනෝ විද්‍යාත්මක මඟපෙන්වීම (ප්‍රායෝගික ක්‍රියාකාරකම් භාවිතා කරමින්) සිදු කිරීම මෙම වැඩසටහනේ පරමාර්ථයයි.

මෙහිදී පවුල් ජීවිතයේ පවතින ගැටලු, පොදු සමාජය හා ගණුදෙනු කිරීමේදී ඇතිවන සමාජීය ප්‍රශ්න, දරුවන් හා දෙමාපියන් අතර වන ගැටලු හා දරුවන් හදා වඩා ගැනීමේදී හා දරුවන්ගේ අධ්‍යාපනික ගැටලු පිළිබඳ පොදුවේ සහභාගිකයින් දැනුවත් කෙරේ. මීට අමතරව සහභාගිකයින් හට පවතින පෞද්ගලික ගැටලු පෞද්ගලිකව සාකච්ඡා කිරිමට ඇවැසි නම් මනෝ උපදේශකයින් කරා යොමු කිරීම ද මෙමඟින් සිදු කරනු ලබයි.

ඒ අනුව, 2017 වර්ෂයේ දී පැවැත්වූ වැඩමුළු පහත පරිදි වේ.

| අනු අංක | වැඩමුළුව පැවැත් වූ ස්ථානය | වැඩමුළුව පැවැත් වූ දිනය | වැඩමුළුව සඳහා සහභාගී වූ ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | FC ශාලාව - වැලිමඩ | 2017.03.24 | 103 |
| 02 | ගම්පොල ලෝක උරුම ශාලාව | 2017.06.28 | 136 |
| 03 | සබරගමු පළාත් සභා ශ්‍රවණාගාරය | 2017.07.24 | 118 |
| 04 | නොච්චියාගම දොන් බොස්කෝ ශාලාව | 2017.08.29 | 156 |
| 05 | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2017.08.31 | 64 |
| 06 | කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2017.10.26 | 45 |
| 07 | කුරුණෑගල තරුණ බෞද්ධ සංගම් ශාලාව | 2017.10.27 | 70 |
| 08 | යටිනුවර ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරය | 2017.11.13 | 85 |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

## 3.4. වෛද්‍ය ආධාර ලබාදීම

ක්‍රියාන්විත හේතූන් මත ආබාධිත විශ්‍රාමික තත්ත්වයට පත්ව රෝගාබාධයන්ට ලක් වූ රණවිරුවන්, ඔවුන්ගේ පවුල් වල ළඟම ඥාතීන් සහ දිවිපිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ගේ වෛද්‍ය ප්‍රතිකාර කටයුතු සඳහා සහාය වීම මෙම වැඩසටහන වෙතින් සිදු කෙරේ.

මේ යටතේ හදිසි සැත්කම් සඳහා ආධාර කිරිම, වෛද්‍ය පරීක්ෂණ සඳහා සහාය වීම, රෝග තත්ත්වයන් මඟහරවා ගැනීමට අත්‍යවශ්‍ය වන වෛද්‍ය උපකරණ ලබාදීම, ආර්ථික අපහසුතා ඇති රෝගයන්ගෙන් පෙලෙන ඉල්ලුම්කරුවන්ට ප්‍රතිකාර ගැනීම සඳහා සහය වීම ආදී කාර්යයන් සඳහා සහය ලබාදීම මෙමඟින් සිදු කරයි.

ඒ අනුව, 2017 වර්ෂයේදී නව ප්‍රතිලාභීන් 48 දෙනෙකු සඳහා ආධාර ලබා දී ඇති අතර දෙවන වර ගෙවීම් 40 ක් සඳහා ආධාර මුදල් ලබා දී ඇත. මීට අමතරව පැරණි වාරික ගෙවීම් 682 ක් සඳහා ද ගෙවීම් කටයුතු සිදු කර ඇත.

## 3.5. වෛද්‍ය ණය ලබාදීම

මාසික වැටුප් හිමිගැන්වෙන ක්‍රියාන්විත හේතූන් මත ආබාධිත විශ්‍රාමික තත්ත්වයට පත්ව රෝගාබාධයන්ට ලක්වූ රණවිරුවන්, ඔවුන්ගේ පවුල් වල ළඟම ඥාතීන් සහ දිවිපිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ගේ වෛද්‍ය ප්‍රතිකාර කටයුතු සඳහා සහාය වීම මෙම වැඩසටහන වෙතින් සිදු කෙරේ.

මේ යටතේ හදිසි සැත්කම් සඳහා ආධාර කිරීම, වෛද්‍ය පරීක්ෂණ සඳහා සහායවීම, රෝග තත්වයන් මගහරවා ගැනීමට අත්‍යවශ්‍ය වන වෛද්‍ය උපකරණ ලබාදීම සිදුකරනු ලබන අතර ලබාදෙනු ලබන ණය මුදල 2.5% ක සේවා ගාස්තුවක් සමඟ නැවත අයකරගනී.

ඒ අනුව 2017 වර්ෂයේ දී ප්‍රතිලාභීන් 03 දෙනෙකු සඳහා ණය මුදල් ලබා දී ඇත.

2017 වර්ෂය තුල වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම වෙනුවෙන් ප්‍රගතිය කරා ළඟා වීම පහත පරිදි වේ.

| රණවිරු නිවාස සැපයීම | 2017 භෞතික | | 2017 මූල්‍ය (රු. මි) | |
|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | වෙන්කිරීම | ප්‍රගතිය |
| වෛද්‍ය සායන | 10 | 09 | 1.45 | 0.95 |
| සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩමුළු | 10 | 10 | 0.70 | 0.60 |
| මනෝ විද්‍යාත්මක වැඩමුළු | 08 | 08 | 0.59 | 0.58 |
| වෛද්‍ය ආධාර ලබා දීම - නව | 100 | 92 | 6.20 | 4.99 |
| වෛද්‍ය ආධාර ලබා දීම - පැරණි වාරික | 936 | 668 | | |
| වෛද්‍ය ණය ලබා දීම | 10 | 03 | 1.00 | 0.30 |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )




( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

# - 04 -

# අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සැලසීම

රණවිරු සේවා අධිකාරියේ පනතින් පැවරී ඇති කර්තව්‍යයන් යටතේ අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාවක් සැලසීම වෙනුවෙන් විවිධ වූ ශිෂ්‍යත්ව ක්‍රම යටතේ රණවිරු සේවා අධිකාරිය මඟින් ශිෂ්‍යාධාර පිරිනමනු ලබයි. එම ශිෂ්‍යත්ව ක්‍රම පහත පරිදි වේ.

- 4.1. රණවිරු දූ දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව ක්‍රමය
- 4.2. අ.පො.ස උ. පෙළ ශිෂ්‍යත්ව ක්‍රමය
- 4.3. උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර
- 4.4. මාපිය කැපකරු ශිෂ්‍යත්ව
- 4.5. අධ්‍යාපන වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා අර්ධ ශිෂ්‍යත්ව
- 4.6. විදේශීය ක්‍රීඩා තරඟ හා අධ්‍යාපන කටයුතු වලට සහභාගීවීම වෙනුවෙන් ආධාර
- 4.7. කුසලතා සංවර්ධන ණය

## 4.1. රණවිරු දූ දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව ක්‍රමය



ක්‍රියාන්විත සේවයේ නියුතුව සිය ජීවිතය පූජා කරන ලද, ආබාධිත විශ්‍රාමික වූ හා දැනට ආබාධිතව සේවයේ නියුතු රණවිරුවන්ගේ දරු දැරියන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා 2005 වසරේ සිට ආරම්භ කෙරුනු රණවිරු දූ දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව ක්‍රමය ජාතික ඉතිරිකිරීමේ බැංකුව හා එක්ව රණවිරුවන්ගේ 6 වසරේ සිට අ.පො.ස සා/පෙළ දක්වා අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක වේ. මෙම දරුවන්ගේ අ.පො.ස සා/පෙළ හා උ/පෙළ අධ්‍යාපන සඳහා රුපියල් 12,000/- ක ඉතුරුම් මුදලක් ලැබෙන සේ මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලැබේ.

2017 වර්ෂයේදී රණවිරු දූ දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ නව ශිෂ්‍යත්ව 489 ක් ලබා දී ඇත. තවද මීට අමතරව පෙර වර්ෂ වල ගෙවීම් සිදු කරමින් ශිෂ්‍යත්ව 1044 යාවත්කාලීන කරමින් පවත්වාගෙන ගොස් ඇත.

## 4.2. අ.පො.ස උ.පෙළ ශිෂ්‍යත්ව ක්‍රමය

අ.පො.ස උ/පෙළ පංති වල අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක මෙම ශිෂ්‍යත්ව ක්‍රමයේදී රණවිරු දූ දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ ශිෂ්‍යත්වලාභියෙකු නොවූ දරුවෙකු සඳහා අ.පො.ස සා/පෙළ පංතියේදී ද නැතහොත් අ.පො.ස සා/පෙළ හොඳින් සමත් වී අ.පො.ස උ/පෙළ සඳහා තේරී පත් වූ විට මසකට රු. 500 බැගින් උපරිම වසර දෙකක් ද ලබාදේ.

මෙහි ප්‍රතිලාභීන්, ක්‍රියාන්විත සේවයේ යෙදී සිට දිවිපිදූ, ආබාධිත විශ්‍රාමික හා දැනට ආබාධිතව සේවයේ නියුතු රණවිරුවන්ගේ අධ්‍යාපනය ලබන දරුවන් වන අතර 2017 වර්ෂයේදී දරුවන් 462 කට හා පවත්වාගෙන යනු ලබන ශිෂ්‍යත්ව 139 ක් සඳහා ආධාර මුදල් ලබා දී ඇත.

## 4.3. උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර

මෙම ශිෂ්‍යාධාර ක්‍රමයෙන් අ.පො.ස උ/පෙළ හොඳින් සමත්වී එහි ප්‍රතිඵල මත විශ්ව විද්‍යාල, විද්‍යාපීඨ හා රජයේ අනුමත උසස් අධ්‍යාපන ආයතන වල අධ්‍යාපනය සඳහා වරම් ලබන දරුවන්ට මසකට රු.2000/- බැගින් ඔවුන්ගේ අධ්‍යයන කාලය තුල ඉදිරියට අධ්‍යයන වර්ෂ 4 ක් ඇතුළත් වන සේ උපරිම වාරික 40ක් මෙම ශිෂ්‍යාධාර පිරිනමනු ලැබේ.

2017 වර්ෂයේදී උසස් අධ්‍යාපනය ලබන දරුවන් 101 දෙනෙකු සඳහා ශිෂ්‍යාධාර ලබා දීම සිදු කර ඇති අතර, පෙර වසර වලදී ලබා පවත්වාගෙන යනු ලබන ශිෂ්‍යත්ව 138 ක් සඳහා ද ශිෂ්‍යාධාර මුදල් ලබා දී ඇත.

**තවද, ව්‍යාපෘතිය මගින් ආරම්භ කරන ලද ඉහත සඳහන් ශිෂ්‍යත්ව පළාත්/ දිස්ත්‍රික් වශයෙන් එම ශිෂ්‍යත්වලාභී දරුවන් කැඳවා ඔවුන් වෙත ලබාදීම සිදු කරන ලද අතර එහි විස්තර පහත පරිදි වේ.**

| අ.අ | පළාත / දිස්ත්‍රික්කය | දිනය | ලබාදුන් ශිෂ්‍යත්ව ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | ත්‍රිකුණාමලය | 2017.02.15 | 12 |
| 02 | අම්පාර | 2017.07.03 | 32 |
| 03 | මධ්‍යම පළාත | 2017.08.21 | 110 |
| 04 | හම්බන්තොට | 2017.09.04 | 88 |
| 05 | කුරුණෑගල | 2017.09.09 | 91 |
| 06 | බස්නාහිර පළාත | 2017.11.14 | 150 |
| 07 | පුත්තලම | 2017.11.16 | 12 |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

## 4.4. මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය




ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය හා ආබාධිත තත්වයට පත්වූ රණවිරුවන්ගේ අධ්‍යාපනය හදාරන වයසේ පසුවන දරුවන්, සියලුම රණවිරුවන්ගේ විශේෂ අධ්‍යාපනය හදාරන වයසේ පසුවන දරුවන් සහ සියලුම රණවිරුවන්ගේ දිර්ඝ කාලීනව ප්‍රතිකාර ලබාගත යුතු රෝගී තත්වයන්ගෙන් පෙළෙන රණවිරුවන්ගේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු බධාවකින් තොරව නිසියාකාරව සිදු කර ගෙන යාමට අත්වැලක් සැපයීම සඳහා මෙම ශිෂ්‍යාධාරය පිරිනමනු ලබයි.

ඒ අනුව එම දරුවන් අ.පො.ස. උ.පෙළ විභාගය වෙත ඉදිරිපත් වන තෙක් මාසිකව මෙම මාපිය කැපකරු ශිෂ්‍යාධාර මුදල් පිරිනමනු ලබන අතර, එය අධිකාරියේ මුදල් යෙදවීම මත හා පරිත්‍යාගශීලීන්ගේ මූල්‍යාමය දායකත්වය මත ලබා දෙයි.

පළමුව අධිකාරියේ මුදල් යෙදවීම මත රු.500/= ක මුදලක් ලබා දෙනු ලබන අතර, ඒ අතරතුර කාලය තුළ කැපකරු මාපියන් ලෙසින් දරුවන්ගේ අධ්‍යාපනයට අතහිත දීමට බලාපොරොත්තුවන

පරිත්‍යාගශීලීන්ගේ ආධාර මුදල් දරුවන් වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු ද කරනු ලබයි. ඒ අනුව මාපිය කැපකරු ශිෂ්‍යත්ව ලබා දීම පිළිබඳ 2017 වර්ෂයේ ප්‍රගතිය පහත පරිදි වේ.

**2017 වර්ෂයේදී එක් එක් මාසයේ දී ගෙවීම් කරන ලද ශිෂ්‍යත්ව ප්‍රමාණයන්**

| අනු අංකය | මාසය | අධිකාරියේ මුදල් යෙදවීම මත ලබා දෙන ලද ශිෂ්‍යත්ව ප්‍රමාණය | පරිත්‍යාගශීලීන්ගේ ආධාර මඟින් ලබා දෙන ලද ශිෂ්‍යත්ව ප්‍රමාණය | මුළු එකතුව |
|---|---|---|---|---|
| 01 | ජනවාරි | 588 | 162 | 750 |
| 02 | පෙබරවාරි | 693 | 63 | 756 |
| 03 | මාර්තු | 633 | 69 | 702 |
| 04 | අප්‍රේල් | 635 | 69 | 704 |
| 05 | මැයි | 638 | 123 | 761 |
| 06 | ජුනි | 639 | 121 | 760 |
| 07 | ජූලි | 645 | 118 | 763 |
| 08 | අගෝස්තු | 607 | 118 | 725 |
| 09 | සැප්තැම්බර් | 586 | 121 | 707 |
| 10 | ඔක්තෝබර් | 587 | 121 | 708 |
| 11 | නොවැම්බර් | 596 | 121 | 717 |
| 12 | දෙසැම්බර් | 597 | 121 | 718 |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

**2017 වර්ෂයේ දී අලුතින් ආරම්භ කරන ලද ශිෂ්‍යත්ව ප්‍රමාණය**

| අනු අංකය | මාසය | අධිකාරියේ මුදල් යෙදවීම මත ආරම්භ කරන ලද ශිෂ්‍යත්ව ප්‍රමාණය | පරිත්‍යාගශීලීන්ගේ ආධාර මඟින් ආරම්භ කරන ලද ශිෂ්‍යත්ව ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | ජනවාරි | 12 | - |
| 02 | පෙරවාරි | 11 | - |
| 03 | මාර්තු | - | 60 |
| 04 | අප්‍රේල් | 02 | - |
| 05 | මැයි | 03 | - |
| 06 | ජුනි | 03 | - |
| 07 | ජූලි | 03 | - |
| 08 | අගෝස්තු | 09 | - |
| 09 | සැප්තැම්බර් | 02 | 01 |
| 10 | ඔක්තෝබර් | 02 | - |
| 11 | නොවැම්බර් | 09 | - |
| 12 | දෙසැම්බර් | 01 | - |
| | එකතුව | 57 | 61 |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

**2017 වර්ෂයේදී ගෙවීම් අවසන් කරන ලද ශිෂ්‍යත්ව ප්‍රමාණය**

| අනු අංකය | මාසය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | ජනවාරි | 01 |
| 02 | පෙරවාරි | 09 |
| 03 | මාර්තු | 54 |
| 04 | අප්‍රේල් | - |
| 05 | මැයි | - |
| 06 | ජුනි | 04 |
| 07 | ජූලි | - |
| 08 | අගෝස්තු | 48 |
| 09 | සැප්තැම්බර් | 21 |
| 10 | ඔක්තෝබර් | 01 |
| 11 | නොවැම්බර් | - |
| 12 | දෙසැම්බර් | - |
| | එකතුව | 138 |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

## 2017 වර්ෂයේ දී මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය මඟින් ඉටු කරන ලද වෙනත් සුභසාධන සේවාවන්

1. විශ්ව විද්‍යාල අධ්‍යාපනය හදාරන දියණියකට පරිත්‍යාගශීලින්ගේ ආධාර මඟින් ලැප්ටොප් පරිගනකයක් ලබා දීමට කටයුතු කර ඇත.
2. තැලසීමියා රෝගී තත්වයෙන් පෙළෙන රණවිරු දියණියක වෙනුවෙන් සිදු කල යුතු ශල්‍යකර්මය සඳහා රු. 100,000.00 ක මුදලක් පරිත්‍යාගශීලින්ගේ ආධාර මඟින් ලබා දීමට කටයුතු කර ඇත. එම ශල්‍යකර්මය සඳහා අවශ්‍ය ඉතිරි මුදල් පරිත්‍යාගශීලීන් වෙතින් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලද අතර ව්‍යාපෘතිය මඟින් කරන ලද ඉල්ලීමකට අනුව DSI ආයතනය වෙතින් රු. 25,000.00 ක මුදලක් හා ඩේවිඩ් පිරීස් ආයතනය වෙතින් රු 300,000.00 ක මුදලක් ඉහත දරුවා වෙත ලබා දීමට කටයුතු කර ඇත.
3. පරිත්‍යාගශීලීන්ගේ ආධාර මඟින් දෘශ්‍යාබාධිත රණවිරුවෙකු වෙත ලැප්ටොප් පරිගනකයක් ලබා දීම.
4. " ජයග්‍රහනය - කොළඹ " සංවිධානය මගින් රණවිරු දරුවන් 15 ක් වෙනුවෙන් ශිෂ්‍යත්ව පිරිනමනු ලැබූ අතර, එම ශිෂ්‍යත්ව ප්‍රදානයන් සඳහා දරුවන් යොමු කිරිම.
5. කුවේට් ශ්‍රී ලංකා එකමුතුව මඟින් රණවිරු දරුවන් 60 දෙනෙකු වෙත ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලැබූ අතර එම ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය පැවැත්වීමට කටයුතු කිරීම.
6. ඉහත ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයේදී ශිෂ්‍යත්වලාභීන් වෙත රු. 3000.00 ක් පමණ වටිනා ඉංග්‍රීසි ශබ්ද කෝෂයක් ලබා දෙනු ලැබූ අතර, එම ශබ්ද කෝෂයන් ව්‍යාපෘතිය මඟින් කරන ලද ඉල්ලීමට අනුව ලංකා බැංකුව විසින් පරිත්‍යාග කරන ලදී.

## 4.5. අධ්‍යාපන වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා අර්ධ ශිෂ්‍යත්ව ලබාදීම

රණවිරු පවුල්වල දූදරුවන්ගේ කාර්මික, තාක්ෂණික අධ්‍යාපනික හා වෘත්තීය නිපුණතාවයන් වැඩි දියුණු කොට ඔවුන් ඉදිරි අනාගතයේදි සාර්ථක වෘත්තියක් කරා යොමු කරවීමේ අරමුණ පෙරදැරි කරගනිමින් මෙම ආධාර මුදල් ලබා දීම සිදු කරයි.

මේ යටතේ රජයේ පිළිගත් ආයතන මඟින් සිදුකරනු ලබන ඕනෑම පාඨමාලාවක් හැදෑරීම සඳහා එම පාඨමාලා ගාස්තුවෙන් (මුදල රු.50,000.00 ක උපරිමයකට යටත්ව) අඩක් අප අධිකාරිය මඟින් ගෙවීම් සිදුකරනු ලබන අතර 2017 වර්ෂයේදී 56 දෙනෙකු සඳහා ආධාර මුදල් ලබා දීම සිදු කර ඇත.

## 4.6. දේශීය, විදේශීය ක්‍රීඩා තරඟ හා අධ්‍යාපන කටයුතු වලට සහභාගී වීම වෙනුවෙන් ආධාර ලබාදීම.

දේශය වෙනුවෙන් තම අඟපසඟ පූජා කර ආබාධිත රණවිරුවා හා ජීවිතය පූජා කල රණවිරුවන්ගේ පවුල්වල ළඟම ඥාතීන් (දුව/ පුතා/ බිරිඳ) වෙතත් රණවිරුවා අවිවාහකයකු නම් දෙමාපියන්ටත්/ අවිවාහක සහෝදර සහෝදරියන්ටත් ඔවුන්ගේ දස්කම් අනුව රටට කීර්තියක් ගෙන දීමේ අරමුණු ඇතිව දේශීය හා ජාත්‍යන්තර මට්ටමේ තරඟ සඳහා සහභාගී වීම වෙනුවෙන් ආධාර ලබාදීම සිදුකර ඇති අතර 2017 වර්ෂයේ දී 20 දෙනෙකු සඳහා ආධාර මුදල් ලබා දීම සිදු කර ඇත.

## 4.7. කුසලතා සංවර්ධන ණය ලබා දීම

දේශීය හා විදේශීය උසස් අධ්‍යාපන ආයතන වෙතින් උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා රණවිරු දරුවන් දිරි ගන්වමින් සහනදායී සේවා ගාස්තුවක් යටතේ උපරිම ලක්ෂ 05 ක මුදලක් මෙම ණය ලබා දීමේ ක්‍රමය යටතේ ලබා දීම සිදු කරයි. ඒ අනුව මෙම ණය ක්‍රමය යටතේ 2017 වර්ෂයේදී එක් අයෙකුට ණය මුදල ලබා දී ඇත.

2017 වර්ෂය තුල අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සැලසීම වෙනුවෙන් ළඟා කර ගත් ප්‍රගතිය පහත පරිදි වේ.

| අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සැලසීම | 2017 භෞතික | | 2017 මූල්‍ය (රු. මි) | |
|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | වෙන්කිරීම | ප්‍රගතිය |
| රණවිරු දූ දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව | 500 | 489 | 16.00 | 16.13 |
| රණවිරු දූ දරු ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව - පවත්වාගෙන යනු ලබන | 1044 | | | |
| අ.පො.ස උ.පෙළ ශිෂ්‍යත්ව - නව | 300 | 462 | | |
| අ.පො.ස උ.පෙළ ශිෂ්‍යත්ව - පැරණි | 139 | | | |
| උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර - නව | 50 | 101 | | |
| උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර - පැරණි | 138 | | | |
| මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය - නව | 965 | 718 | 6.87 | 5.42 |
| අධ්‍යාපන වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා අර්ධ ශිෂ්‍යත්ව | 50 | 56 | 4.50 | 3.68 |
| දේශීය විදේශීය ක්‍රීඩා තරඟ හා අධ්‍යාපන කටයුතු වලට සහභාගි වීම වෙනුවෙන් ආධාර | 20 | 20 | | |
| කුසලතා සංවර්ධන ණය | 04 | 01 | 2.00 | 0.50 |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )




( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

# - 05 -

# ඵලදායී සේවා නියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහාය වීම.

රණවිරු සේවා අධිකාරියේ පනතින් පැවරී ඇති කර්තව්‍යයන් යටතේ ඵලදායී සේවා නියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහාය වීම සඳහා රණවිරු ප්‍රජාව වෙනුවෙන් පහත ව්‍යාපෘති ක්‍රියාවට නංවා ඇත.

5.1. ස්වයං රැකියා ණය ලබා දීම.
5.2. ස්වයං රැකියා ආධාර ලබා දීම.
5.3. පුහුණු වැඩමුළු පැවැත්වීම

## 5.1. ස්වයං රැකියා ණය ලබා දීම.

රණවිරු ප්‍රජාවට ස්වයං රැකියා ආරම්භ කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය පහසුකම් ලබා දීම යටතේ වාර්ෂිකව 5% ක සේවා ගාස්තුවක් පමණක් අයකර රු. 200,000.00 ක ණය මුදලක් ලබා දෙනු ලැබේ.

ඒ අනුව, 2017 වර්ෂයේ ස්වයං රැකියාවක් ආරම්භ කිරීම හා වැඩිදියුණු කිරීම වෙනුවෙන් ස්වයං රැකියා ණය 17 ක් ලබා දී ඇත.

## 5.2. ස්වයං රැකියා ආධාර ලබා දීම.

වැටුප් නොලබන රණවිරු ප්‍රජාවට ණය මුදල් ලබාදීමේ හැකියාවක් නොමැති අතර ( ණය ගෙවීමේ හැකියාවක් නොමැති නිසා ) ස්වයං රැකියාවක් ආරම්භ කිරීම හෝ වැඩිදියුණු කරගැනීම සඳහා රු. 50,000.00 ක ආධාර මුදලක් ලබා දෙනු ලැබේ.

ඒ අනුව 2017 වර්ෂයේ ස්වයං රැකියා ආධාර 28 ක් ලබා දී ඇත.

## 5.3. පුහුණු වැඩමුළු පැවැත්වීම.



රණවිරු ප්‍රජාව ස්වයං රැකියා සඳහා පෙළඹවීම, යොමු කරවීම, වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය දැනුම, තාක්ෂණය හා පුහුණුව ලබාදීම සඳහා වැඩමුළු පවත්වනු ලැබේ.

ඒ අනුව, 2017 වර්ෂයේදී ව්‍යාපාර අවස්ථාවලට පෙළඹවීමේ මූලික පුහුණු වැඩමුළු 14 ක් ද, ලී පොල් කටු ආශ්‍රිත විසිතුරු නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩමුළු 10 ක් ද කඩදාසි ආශ්‍රිත විසිතුරු නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩමුළු 08 ක් ද, මැහුම් ආශ්‍රිත පුහුණු වැඩමුළු 21 ක් ද, ආහාර නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩමුළු 04 ක් ද, ගෙවතු වගාව ආශ්‍රිත පුහුණු වැඩමුළු 08 ක් ද, වෙනත් පුහුණු වැඩමුළු 03 ක් ද වශයෙන් වැඩමුළු 68 ක් පවත්වා ඇත.

එම වැඩමුළු වල විස්තර පහත පරිදි වේ.

➢ **ව්‍යාපාර අවස්ථාවලට පෙළඹවීමේ මූලික පුහුණු වැඩමුළ.**

| අනු අංකය | දිස්ත්‍රික්කය | පැවැත්වූ දිනය | පැවැත්වූ ස්ථානය | සහභාගී වූ ප්‍රමාණය |
|---|---|---|---|---|
| **01** | මහනුවර | 2017.03.10 | මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය- මහනුවර | **36** |
| **02** | මාතලේ | 2017.03.13 | මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරය | **39** |
| **03** | මාතර | 2017.03.13 | මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ගාමිණී ජයසේකර ශ්‍රවණාගරය | **38** |
| **04** | පුත්තලම | 2017.04.21 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- හලාවත | **42** |
| **05** | බදුල්ල | 2017.04.24 | බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරය | **39** |
| **06** | මොණරාගල | 2017.04.25 | මොණරාගල නගර ශාලාව | **40** |
| **07** | රත්නපුර | 2017.05.03 | රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරය | **25** |
| **08** | කෑගල්ල | 2017.05.16 | කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරය | **36** |
| **09** | හම්බන්තොට | 2017.05.25 | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය 17 වන සම්මන්ත්‍රණ ශාලාව | **70** |
| **10** | අම්පාර | 2017.06.05 | අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය D.M. ආරියරත්න ශ්‍රවණාගාරය | **30** |
| **11** | පොළොන්නරුව | 2017.07.11 | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | **24** |
| **12** | කුරුණෑගල | 2017.07.12 | කුරුණෑගල රතුකුරුස සංගම් ශාලාව | **43** |
| **13** | අනුරාධපුර | 2017.07.27 | උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය | **40** |
| **14** | ත්‍රිකුණාමලය | 2017.10.06 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය | **40** |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

➢ **ලී පොල් කටු ආශ්‍රිත විසිතුරු නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩමුළු**

| අනු අංකය | දිස්ත්‍රික්කය | පැවැත්වූ දිනය | වැඩමුළුවේ නම | සහභාගී වූ ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | මාතලේ | 2017.09.12 | ලී පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය | 29 |
| 02 | කොළඹ | 2017.09.14 | ලී පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය | 19 |
| 03 | ගම්පහ | 2017.09.19 | ලී පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය | 15 |
| 04 | කළුතර | 2017.09.21 | ලී පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය | 12 |

| | | | | |
|---|---|---|---|---|
| 05 | කෑගල්ල | 2017.09.22 | ලී පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය | 22 |
| 06 | කුරුණෑගල | 2017.09.26 | ලී පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය | 25 |
| 07 | පුත්තලම | 2017.09.28 | ලී පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය | 17 |
| 08 | අනුරාධපුර | 2017.10.20 | ලී පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය | 27 |
| 09 | රත්නපුර | 2017.11.13 | ලී පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය | 19 |
| 10 | මහනුවර | 2017.11.23 | ලී පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය | 23 |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

- **කඩදාසි ආශ්‍රිත විසිතුරු නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩමුළු**

| අනු අංකය | දිස්ත්‍රික්කය | පැවැත්වූ දිනය | වැඩමුළුවේ නම | සහභාගී වූ ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | කළුතර | 2017.09.06 | කඩදාසි ආශ්‍රිත විසිතුරු නිෂ්පාදන | 13 |
| 02 | ගම්පහ | 2017.09.12 | කඩදාසි ආශ්‍රිත විසිතුරු නිෂ්පාදන | 19 |
| 03 | කොළඹ | 2017.09.29 | කඩදාසි ආශ්‍රිත විසිතුරු නිෂ්පාදන | 40 |
| 04 | මොණරාගල | 2017.09.30 | කඩදාසි ආශ්‍රිත විසිතුරු නිෂ්පාදන | 30 |
| 05 | බදුල්ල | 2017.10.01 | කඩදාසි ආශ්‍රිත විසිතුරු නිෂ්පාදන | 28 |
| 06 | කෑගල්ල | 2017.11.16 | කඩදාසි ආශ්‍රිත විසිතුරු නිෂ්පාදන | 23 |
| 07 | මාතලේ | 2017.11.17 | කඩදාසි ආශ්‍රිත විසිතුරු නිෂ්පාදන | 25 |
| 08 | මහනුවර | 2017.12.07 | කඩදාසි ආශ්‍රිත විසිතුරු නිෂ්පාදන | 18 |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

- **මැහුම් ආශ්‍රිත පුහුණු වැඩසටහන්**

| අනු අංකය | දිස්ත්‍රික්කය | පැවැත්වූ දිනය | වැඩමුළුවේ නම | සහභාගී වූ ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | බදුල්ල | 2017.06.27 | මැහුම් පුහුණු පාඨමාලාව | 70 |
| 02 | කොළඹ | 2017.07.25 | මැහුම් පුහුණු පාඨමාලාව | 11 |
| 03 | කොළඹ | 2017.08.29 | මැහුම් පුහුණු පාඨමාලාව | 25 |
| 04 | අම්පාර | 2017.10.10 | අත් බෑග් නිෂ්පාදනය | 32 |
| 05 | අම්පාර | 2017.10.16 | අත් බෑග් නිෂ්පාදන පුහුණුව | 13 |
| 06 | අම්පාර | 2017.10.23 | අත් බෑග් නිෂ්පාදනය | 25 |
| 07 | හම්බන්තොට | 2017.10.23 | සාරි ජැකට් මැසීම | 26 |
| 08 | මාතර | 2017.10.25 | මැහුම් පුහුණු පාඨමාලාව | 20 |
| 09 | මොණරාගල | 2017.10.30 | මැහුම් පුහුණු පාඨමාලාව | 25 |

| | | | | |
|---|---|---|---|---|
| 10 | මොණරාගල | 2017.11.15 | මැහුම් පුහුණු පාඨමාලාව | 15 |
| 11 | බදුල්ල | 2017.11.20 | පැච් වර්ක් පාඨමාලාව | 15 |
| 12 | බදුල්ල | 2017.11.21 | පැච් වර්ක් පාඨමාලාව | 15 |
| 13 | බදුල්ල | 2017.11.22 | තිරරෙදි පාඨමාලාව | 15 |
| 14 | මාතලේ | 2017.11.23 | තිරරෙදි පාඨමාලාව | 32 |
| 15 | මාතලේ | 2017.11.24 | තිරරෙදි පාඨමාලාව | 32 |
| 16 | මාතලේ | 2017.11.25 | තිරරෙදි පාඨමාලාව | 32 |
| 17 | කළුතර | 2017.11.28 | විසිතුරු බෑග් නිෂ්පාදනය හා සාරි ජැකට් මැසීම | 16 |
| 18 | ගම්පහ | 2017.11.30 | මැහුම් පුහුණු පාඨමාලාව | 30 |
| 19 | ගම්පහ | 2017.12.05 | මැහුම් පුහුණු පාඨමාලාව | 17 |
| 20 | ත්‍රිකුණාමලය | 2017.12.08 | මදුරු දැල් නිෂ්පාදනය කිරීමේ පාඨමාලාව | 17 |
| 21 | කුරුණෑගල | 2017.12.14 | අත්බෑග් නිෂ්පාදනය | 25 |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

➢ **ආහාර නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩමුළු**

| අනු අං | දිස්ත්‍රික්කය | පැවැත්වූ දිනය | වැඩමුළුවේ නම | සහභාගී වූ ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | හම්බන්තොට | 2017.09.18 | රස කැවිලි නිෂ්පාදනය | 30 |
| 02 | පොළොන්නරුව | 2017.09.27 | යෝගට් නිෂ්පාදනය/ පැළ බද්ධ කිරීමේ තාක්ෂණය | 25 |
| 03 | රත්නපුර | 2017.09.28 | ආහාර නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ | 17 |
| 04 | කොළඹ | 2017.11.17 | වෙඩින් කේක් නිෂ්පාදනය | 30 |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

➢ **ගෙවතු වගාව ආශ්‍රිත පුහුණු වැඩමුළු**

| අනු අං | දිස්ත්‍රික්කය | පැවැත්වූ දිනය | වැඩමුළුවේ නම | සහභාගී වූ ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | මාතර | 2017.10.03 | මල් වගාව ආශ්‍රිත කෘෂිකර්ම පුහුණු වැඩමුළුව | 24 |
| 02 | කොළඹ | 2017.10.31 | ගෙවතු වගාව පිළිබඳ පුහුණු වැඩමුළුව | 24 |
| 03 | පුත්තලම | 2017.11.13 | ඕකිඩ් වගාව පිළිබඳ පුහුණු වැඩමුළුව | 23 |
| 04 | ගම්පහ | 2017.11.27 | මල් වගාව පිළිබඳ පුහුණු වැඩමුළුව (ඕකිඩ්) | 27 |
| 05 | කෑගල්ල | 2017.11.30 | ගෙවතු වගා උපදේශන වැඩමුළුව | 22 |
| 06 | පොළොන්නරුව | 2017.11.30 | පැළ බද්ධය පිළිබඳ පුහුණු වැඩමුළුව | 25 |
| 07 | පුත්තලම | 2017.12.11 | ඇන්තූරියම් වගාව පිළිබඳ පුහුණු වැඩමුළුව | 17 |
| 08 | අනුරාධපුර | 2017.12.14 | පැළ බද්ධය පිළිබඳ පුහුණු වැඩමුළුව | 28 |

## ➢ වෙනත් පුහුණු වැඩමුළු

| අනු අංකය | දිස්ත්‍රික්කය | පැවැත්වූ දිනය | වැඩමුළුවේ නම | සහභාගී වූ ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | අම්පාර | 2017.11.09 | L.E.D බල්බ් නිෂ්පාදනය | 21 |
| 02 | මඩකළපුව | 2017.11.28 | කාබනික පොහොර නිෂ්පාදනය | 50 |
| 03 | ගම්පහ | 2017.12.12 | රූපලාවන්‍ය පිළිබඳ පුහුණුව | 20 |

2017 වර්ෂය තුල ඵලදායී සේවා නියුක්තියක් සුරක්ෂිත කිරිමෙහි ලා සහාය වීම වෙනුවෙන් රණවිරු සේවා අධිකාරිය ප්‍රගතිය කරා ළඟාවීම පහත පරිදි වේ.

| ඵලදායී සේවා නියුක්තියක් සුරක්ෂිත කිරිමෙහි ලා සහාය වීම | 2017 භෞතික | | 2017 මූල්‍ය (රු. මි) | |
|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | වෙන්කිරීම | ප්‍රගතිය |
| ස්වයං රැකියා ණය ලබා දීම | 47 | 17 | 7.92 | 4.40 |
| ස්වයං රැකියා ආධාර ලබා දීම | 50 | 28 | 2.50 | 1.50 |
| පුහුණු වැඩමුළු පැවැත්වීම | 82 | 68 | 1.29 | 1.04 |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )




( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

# - 06 -

# අධිකාරියේ කර්තව්‍යන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු දෑ කිරීම.

රණවිරු සේවා අධිකාරියේ කර්තව්‍යන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු දෑ කිරීම යටතේ පහත සඳහන් ව්‍යාපෘති, වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

6.1. රණවිරු මාපිය සුරැකුම් වැඩසටහන
6.2. රණවිරු මාපිය රැකවරණ ප්‍රතිලාභය
6.3. රණවිරු සංසද දිස්ත්‍රික් දැනුවත් කිරිම
6.4. රණවිරු අනුස්මරණ ව්‍යාපෘතිය
6.5. මයිලපිටිය උද්‍යානයේ නඩත්තු හා සංවර්ධන කටයුතු
6.6. යාකබැද්ද - රණවිරු වැඩිහිටි සුරක්ෂා මැදුර සහ සම්පත් මධ්‍යස්ථානය
6.7. " විරුසර " වරප්‍රසාද කාඩ්පත
6.8. රණවිරු සුවඳ සාහිත්‍ය උත්සවය
6.9. රණවිරු කාන්තා හා ළමා සංවර්ධන ඒකකය
6.10. ක්‍රීඩා අංශය
6.11. රණවිරු ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරිම

## 6.1. රණවිරු මාපිය සුරැකුම් වැඩසටහන

ක්‍රියාන්විත රාජකාරියේදී මියගිය හා අතුරුදහන් විවාහක රණවිරුවන්ගේ දෙමව්පියන් වෙත 2007 වසරේ නොවැම්බර් මස 21 වන දින සිට රණවිරුවාගේ වැටුපෙන් 25% ක් ඔහුගේ දෙමව්පියන් වෙත ගෙවීම සිදු කරනු ලබයි. එහෙත් ඉහත කාල සීමාවට පෙර මියගිය විවාහක රණවිරුවන්ගේ දෙමව්පියන්ට කිසිදු දීමනාවක් නොලැබෙන අතර, එම දෙමව්පියන්ට කෘතගුණ සැලකීමක් වශයෙන් අප අධිකාරිය මඟින් රජයේ විශ්‍රාමික වැටුප් නොලබන රණවිරු දෙමව්පියන් වෙත රණවිරු මාපිය සුරැකුම් වැඩසටහන යටතේ මුල්‍යාධාර පිරිනමනු ලබයි.

මෙම ප්‍රතිලාභයට දායක වන සෑම දෙමව්පියෙකුටම රණවිරු සේවා අධිකාරිය මඟින් ජාතික ඉතිරි කිරිමේ බැංකුවේ ගිණුම් ආරම්භ කරනු ලබන අතර, දෙමව්පියන් දෙදෙනාගෙන් එක් අයෙකු පමණක් සිටි නම් මාසිකව රු. 2,250.00 බැගින් ද, දෙමව්පියන් දෙදෙනාම සිටී නම් මාසිකව රු. 1,500.00 බැගින් රු. 3,000.00 ක මුදලක් ද ලබා දීම සිදු කරයි.

මාස 06 කට වරක් රණවිරු සේවා අධිකාරිය මඟින් මෙම මුදල් තැන්පත් කිරීම සිදු කරනු ලබන අතර, එක් මසකට ලබා ගත හැකි වන්නේ අදාල මුදල පමණි. තෝරාගත් ප්‍රතිලාභීන්ගේ ගිණුම් වලට බැර කරන මුදල් ලබා ගත හැකි වන්නේ අදාල ප්‍රතිලාභියාට පමණි. ප්‍රතිලාභියා මියගිය විට ගිණුම අහෝසි වන අතර, ගිණුම් පොත හා මරණ සහතිකයේ පිටපතක් සහිතව අධිකාරිය වෙත එවීමට කටයුතු කල

යුතුය. එවිට දෙමව්පියන් දෙදෙනාම සිටින විට ජීවත්ව සිටින තැනැත්තාගේ මුදල් වැඩිකිරිමට කටයුතු කරනු ඇත.

ඒ අනුව 2017 වර්ෂයේ මාපිය සුරැකුම් ගිණුම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝම්බර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පැරණි ගිණුම් | 1416 | 1416 | 1416 | 1416 | 1416 | 1416 | 1430 | 1430 | 1430 | 1430 | 1430 | 1433 |
| නව ගිණුම් | 3 | 6 | 7 | 5 | | | | 8 | | | 3 | |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

## 6.2. රණවිරු මාපිය රැකවරණ ප්‍රතිලාභය

යුද්ධයේදී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව දිවිපිදූ, අතුරුදහන් හා ආබාධිත තත්වයට පත්ව වෛද්‍ය හේතූන් මත විශ්‍රාමිකව සිටින (රණවිරු සේවා අධිකාරියේ පනත යටතට ගැනෙන ) රණවිරුවන්ගේ ජීවත්ව සිටින දෙමාපියන් වෙත ගෙවනු ලබන මාපිය රැකවරණ දීමනාව ( රු. 750.00 ) මසකට වරක් ලබාදීම රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙතින් සිදු කරනු ලබයි. මෙම දීමනාව සඳහා මුදල් බැර කරනු ලබන්නේ ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකු වලින් නිකුත් කරනු ලබන මාපිය රැකවරණ ගිණුම් සඳහා පමනි.

රණවිරු දරුවන් කිහිප දෙනෙකු සිටියද ජීවත්වී සිටින රණවිරු මවට සහ පියාට වෙන් වෙන්ව මසකට ලැබෙනුයේ රු 750/= ක් බැගිනි. මියගිය රණවිරුවෙකු සහ ජීවත්වන රණවිරු දරුවෙකු සිටී නම්, මියගිය රණවිරුවා වෙනුවෙන් දීමනාව ගෙවනු ලැබේ. මව, පියා ජීවත්වන තුරු පමණක් මෙම දීමනාව හිමි වන අතර කිසිවෙකුටත් මෙම දීමනාව පැවරිය නොහැක.මව පියා මියගිය වහා අදාළ බැංකුව වෙත පාස්පොත ආපසු භාරදිය යුතු අතර රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙත උක්ත අයගේ මරණ සහතිකයේ පිටපත ලබාදිය යුතුය.

දීමනාලාභියා වෙනුවෙන් මාස 06 කට වතාවක් සෑම වසරකම ජුනි 15 සහ දෙසැම්බර් 15 දිනට පෙර ජීවත්ව සිටින බවට සහතිකයක් ග්‍රාම සේවා නිළධාරී විසින් සහතික කිරීමෙන් පසු රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙත එවිය යුතු වේ. ඒ අනුව 2017 වර්ෂයට අදාලව ප්‍රතිලාභීන් 35,446 ක් වෙත මාපිය රැකවරණ දීමනාව හිමිගන්වා ඇත.

## 6.3. රණවිරු සංසද දිස්ත්‍රික් දැනුවත් කිරිම

දිවිපිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් හා ආබාධිත විශ්‍රාමික රණවිරුවන්ගේ ළඟම ඥාතීන් අතර අන්‍යෝන්‍ය සහ සම්බන්ධතාව ගොඩනැංවීම තුලින් එම පවුල් වල මනෝ සමාජීය සංවර්ධනය හා රණවිරු නාමය සදා අනුස්මරණය කිරීම උදෙසා රණවිරු සේවා අධිකාරියට අයත් නිල සන්නිවේදන ජාලය "රණවිරු සංසද" වේ.

රණවිරු සංසද පරිපාලනය සඳහා රණවිරු සංසද ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් කර ඇත. රණවිරු සංසද 273 ක් දැනට පවත්වාගෙන යන අතර දිස්ත්‍රික් මට්ටමින් සංසද නිළධාරින් දැනුවත් කරමින් වැඩටහන් පැවැත්වීම පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් මාර්ගයෙන් සිදු කරනු ලබයි. ඒ අනුව 2017 වර්ෂයේ දිස්ත්‍රික් දැනුවත් කිරීම් 8 ක් පවත්වා ඇත.

## 6.4. රණවිරු අනුස්මරණ ව්‍යාපෘතිය



රණවිරු සේවා අධිකාරියේ කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීම හා හිතකර සියලු ක්‍රියා හා කටයුතු කිරීම යටතේ තම මාතෘ භූමියේ චිරස්ථිතිය උදෙසා තම ජීවිතය මිහිතලය මත පූජා කළ හා තම ශරීරාංග කැප කළ වීර වික්‍රමාන්විත රණවිරුවාගේ නාමය අඛණ්ඩව සුරක්ෂිත කිරීම හා ඔවුන්ගේ සුභ සාධන අවශ්‍යතා සපුරාලීම සඳහා ක්‍රියාත්මක වීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරයි. ඒ යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරයි.

➢ **ජාතික රණවිරු දින සැමරුම් උත්සවය**

ශ්‍රී ලංකා භූමිය ත්‍රස්තවාදයෙන් මුදවා රටේ ඒකීයභාවය, ස්වෛරීත්වය හා සියලු ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් තම උත්තරීතර ජීවිතය මිහිතලය මත පූජා කළ වීර වික්‍රමාන්විත රණවිරු නාමය අනුස්මරණය කිරීම උදෙසාත්, ජාතියේ අභිමානවත් ගෞරවය පුද කිරීම උදෙසාත් ජාතික හා පළාත් මට්ටමින් 2001 වසරේ සිට මේ දක්වා රණවිරු සැමරුම් උත්සව ක්‍රියාත්මක කරනු ලබයි.

2017 වර්ෂයේ ජාතික රණවිරු සැමරුම් උත්සවය බත්තරමුල්ල පාර්ලිමේන්තු ක්‍රීඩාංගනයේ ජාතික රණවිරු සැමරුම් උද්‍යානයේ රණවිරු ස්මාරකය අභියසදී අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක බලකා නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2017.05.19 වන දින අභිමානවත් ලෙස පවත්වන ලදි.

➢ **පළාත් රණවිරු සැමරුම් උත්සව**

වීරෝධාර රණවිරුවන් හා ඥාතීන්, ඒ ඒ පළාත් වශයෙන් ඒකරාශි කරමින් ඔවුන් තුළ පවතින ගැටළු හා යෝජනා ලබා ගැනීම සඳහා සහ පළාත් වශයෙන් මෙම රණවිරුවන්ගේ හා ළඟම ඥාතීන්ගේ සුභ සාධනය නගා සිටුවීම උදෙසා ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව, 2017 වර්ෂයේ පළාත් රණවිරු සැමරුම් උත්සව පැවැත්වූ ස්ථාන පහත පරිදි වේ.

| පළාත | පැවැත් වූ ස්ථානය |
|---|---|
| මධ්‍යම පළාත | මයිලපිටිය රණවිරු ස්මාරකය |
| වයඹ පළාත | කුරුණෑගල රණවිරු ස්මාරකය |
| උතුරු මැද පළාත | අනුරාධපුර මහජන ක්‍රීඩාංගනය අසල රණවිරු ස්මාරකය |
| උතුරු පළාත | කිලිනොච්චියේ දී |
| නැගෙනහිර පළාත | ත්‍රිකුණාමලයේ දී |
| ඌව පළාත | බදුල්ල වින්සන් ඩයස් ක්‍රීඩාංගනය අසල රණවිරු ස්මාරකය |
| සබරගමුව පළාත | රත්නපුර නව නගර රණවිරු ස්මාරකය |
| දකුණු පළාත | ගාල්ල රණවිරු ස්මාරකය |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

## 6.5. මයිලපිටිය උද්‍යානයේ නඩත්තු හා සංවර්ධන කටයුතු

ශ්‍රී ලංකා භූමිය ත්‍රස්තවාදයෙන් මුදවා ගැනීමේදී දිවිපිදූ රණවිරුවන් සිහිකරලීම සඳහා ඉදි වූ ශ්‍රී ලංකාවේ පළමු ජාතික රණවිරු උද්‍යානය මෙය වේ. ආකර්ෂණීය භූමි භාගයක පවත්වා ගෙන යනු ලබන මයිලපිටිය රණවිරු සැමරුම් උද්‍යානයේ දිවි පිදූ රණවිරුවන්ගේ සියළුම නම් ශෛලමය ලේඛන මත සටහන් කොට රණවිරුවන් අනුස්මරණය කිරීම සඳහා ස්මාරකයක් ලෙස ඉදි කොට ඇත.

මෙම උද්‍යානයේ ජලය, විදුලිය හා නඩත්තු සඳහා වැය දැරීම් රණවිරු සේවා අධිකාරිය විසින් සිදු කරනු ලබන අතර ශ්‍රී ලංකා යුධ හමුදාව ඒ සඳහා සහයෝගය ලබා දීම සිදු කරනු ලැබේ.

## 6.6. යාකබැද්ද - රණවිරු වැඩිහිටි සුරක්ෂා මැදුර සහ සම්පත් මධ්‍යස්ථානය



මාතෘභූමිය වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කළ ත්‍රිවිධ හමුදාවේ හා පොලීසියේ රණවිරුවන්ගේ ( විවාහක/ අවිවාහක ) හවිහරණක් නොමැති අසරණභාවයට පත් දෙමාපියන් පිළිබඳ තොරතුරු වාර්තාවී ඇති අතර, ඉන් සමහර මාපියන් තම එකම දරුවා යුද්ධයේදී ජීවිතය පූජාකළ නිසාවෙන් තම වයෝවෘද්ධ ජීවිතයට පිළිසරණක් නැති සමාජ රැකවරණය අවශ්‍ය තත්ත්වයට පත්ව ඇත.

ඒ අනුව කමනි රත්නායක, මහින්ද රත්නායක, ඥාණානන්ද රත්නායක ඇතුලු පවුලේ ඥාතීන් විසින් රණවිරු සේවා අධිකාරිය වෙත පරිත්‍යාග කරන ලද අකුරැස්ස යාකබැද්ද ප්‍රදේශයේ ඇති ඉඩමක පිහිටි ගොඩනැඟිල්ල **" රණවිරු වැඩිහිටි සුරක්ෂා මැදුර සහ සම්පත් මධ්‍යස්ථානය "** නමින් මේ වන විට සංවර්ධනය කරමින් පවතින අතර ඉදිරියේදී විවෘත කිරීමට කටයුතු සූදානම් කරමින් පවතී.

## 6.7. " විරුසර " වරප්‍රසාද කාඩ්පත




පුරා දශක තුනකට අධික කාලයක් එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට එරෙහිව පැවති යුද්ධයේ දී තම ජීවිත හා ශරීරාංග රට වෙනුවෙන් පූජා කරමින් යුද්ධය නිම කිරීම සඳහා සාධනීය අමිල දායකත්වයක් සපයා දෙන ලද යුධ, නාවික, ගුවන් ,පොලිස් හා සිවිල් ආරක්ෂක සේවයේ සාමාජිකයන් සිදු කරන ලද අමිල කැප කිරීමට කෘත ගුණ සැලකීමක් ලෙස අතිගරු ජනපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ආශීර්වාදයෙන් හා ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රුවන් විජයවර්ධන මැතිතුමාගේ සංකල්පනාවෙන් " විරුසර වරප්‍රසාද කාඩ්පත " බිහි විය. මෙම විරුසර වරප්‍රසාද කාඩ්පත අදියරයන් දෙකක් යටතේ ක්‍රියාත්මක වේ.

**පළමු අදියර** ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තුමේන්තුව හා සිවිල් ආරක්ෂක බලකායේ සේවය කරමින් ක්‍රියාන්විතයේදී ජීවිත පරිත්‍යාග කල සහ අතුරුදහන් වූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් වෙත හා ක්‍රියාන්විතයේදී ආබාධිත තත්වයට පත් රණවිරුවන් හට.

**දෙවන අදියර** යුධමය කාලසීමාව තුළ එනම් 1983 සිට 2009 දක්වා ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තුමේන්තුව හා සිවිල් ආරක්ෂක බලකාය තුළ යහපත් පැවැත්මෙන් සේවය කර 2009 වන විට නිළධාරීන් සඳහා නියමිත වසර 20 ක, සෙසු නිලයන් සඳහා නියමිත වසර 22 ක හෝ කාන්තා නිළධාරි/ සෙසු නිලයන් සඳහා නියමිත වසර 15 ක සේවා කාලය සපුරා දැනට විශ්‍රාම ගොස් සිටින හෝ තවදුරටත් සේවයේ දී සිටින රණවිරුවන් වෙත.

මෙම ව්‍යාපෘතිය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය යටතේ රණවිරු සේවා අධිකාරිය හා සහසම්බන්ධව 2016 ජනවාරි 25 දින සිට ක්‍රියාත්මක වේ. මේ වන විටත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන 68 කට අධික සංඛ්‍යාවක් මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ වෙමින් රණවිරු කුටුම්භයන් වෙත ප්‍රතිලාභ සලසමින් පවතී. මෙමඟින් ප්‍රතිලාභ ලබන සංඛ්‍යාව ආසන්න වශයෙන් 120,000 ක් පමණ වේ. ඒ අනුව පහත සඳහන් පරිදි ප්‍රතිලාභ ලබා දෙන ආයතන වර්ග කර දැක්විය හැකිය.

- බැංකු
- මූල්‍ය හා කල්බදු
- රක්ෂණ
- සන්නිවේදන
- අධ්‍යාපන හා වෘත්තීය පුහුණු
- සෞඛ්‍යය
- ප්‍රවාහන
- පාරිභෝගික සැපයුම්

ඒ අනුව 2017.12.31 දිනට විරුසර වරප්‍රසාද කාඩ්පත් නිකුත් කිරීම පහත පරිදි වේ.

| අදියර | මුද්‍රණය කර ඇති කාඩ් පත් ප්‍රමාණය | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|
| | යුධ හමුදාව | නාවික හමුදාව | ගුවන් හමුදාව | පොලිසිය | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | |
| 1 | 25,357 | 1,364 | 608 | 2,766 | 350 | 30,445 |
| 2 | 2,620 | 928 | 1,306 | 2,200 | 620 | 7,674 |
| **එකතුව** | **27,977** | **2,292** | **1,914** | **4,966** | **970** | **38,119** |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

**විරුසර වරප්‍රසාද කාඩ්පත් මඟින් ප්‍රතිලාභීන් හට මේ දක්වා ලැබී ඇති ප්‍රතිලාභ**

- **ශිෂ්‍යත්ව**

| ආයතනය | පාඨමාලාව | පාඨමාලාවක වටිනාකම (රු.) | ලබා දීමට නියමිත පාඨමාලා සංඛ්‍යාව | මුළු වටිනාකම (රු) | මේ දක්වා ලබා දී ඇති ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| බ්‍රිටිෂ් වේ ඉංග්‍රීසි ආයතනය | ඉංග්‍රීසි පාඨමාලා | 23,750.00 | 200 | 4,750,000.00 | 56 |
| ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම | විශ්ව විද්‍යාල සිසුන් සඳහා ශිෂ්‍යත්ව | 50,000.00 | 22 | 1,100,000.00 | 22 |
| සිංගර් ශ්‍රී ලංකා ආයතනය | මැහුම් පාඨමාලා | 15,000.00 | 100 | 1,500,000.00 | 100 |
| ගෝලීය මානුෂීය පදනම | කොත්වල විද්‍යා පියයේ ඉංජිනේරු සිසුවෙකු සඳහා ශිෂ්‍යත්වයක් | 50,000.00 | 1 | 50,000.00 | 1 |
| **එකතුව** | | | | **7,400,000.00** | |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

- **නිවාස ඉදිකිරිම සඳහා ඉඩම්**

| නිලය | නම | ආරක්ෂක අංශය | ප්‍රදේශය | ප්‍රමාණය (පර්චස්) | වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| නා.ගු.භ | හෙට්ටිආරච්චි පී.පී. | ගුවන් හමුදාව | ගම්පහ | 06.25 | 1,875,000.00 |
| | කේ.ඒ.ආර් ද අල්විස් | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | ගම්පහ | 05.25 | 1,575,000.00 |
| පො.කො | එන්.ඩබ්.පී.එල්.ආර්. පෙරේරා | පොලිසිය | ගම්පහ | 05.25 | 1,575,000.00 |
| සා.සෙ | පාලිත ඩී.එස්.ඒ | යුධ හමුදාව | ගම්පහ | 06.25 | 1,875,000.00 |
| සා.සෙ | කුමාර එච්.එම්.පී | යුධ හමුදාව | ගම්පහ | 05.35 | 1,605,000.00 |
| සු.නී | කරුණාරත්න පී.ඩබ්.යු | නාවික හමුදාව | ගම්පහ | 05.35 | 1,605,000.00 |
| **එකතුව** | | | | | **10,110,000.00** |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

## 6.8. රණවිරු සුවඳ සාහිත්‍ය උත්සවය



රණවිරු සාහිත්‍යක් ගොඩනැංවීමට අවශ්‍ය වන පරිදි ජාතික, පළාත් හා ප්‍රාදේශීය මට්ටමින් රණවිරු සාහිත්‍ය නිර්මාණ කෙරෙහි උද්යෝගය වර්ධනය කිරීම උදෙසා, රණවිරු පවුල්වල සාමාජිකයන්ගේ සහ රණවිරුවන්ගේ කලා දක්ෂතාවයන් හා කුසලතාවයන් ඔප්නැංවීම සහ ඇගයීමක් ලබා දීම සඳහා තරඟාවලියක් වාර්ෂිකව පැවැත්වීම මෙමඟින් සිදු කරනු ලබයි.

මෙහි ඉලක්ක කණ්ඩායම අබාධිත සහ සේවයේ යෙදී සිටින රණවිරුවන් මෙන්ම දිවිපිදූ, අතුරුදන් රණවිරුවන්ගේ දූ දරුවන්, දෙමාපියන්, බිරින්දෑවරුන් අවිවාහක සහෝදර සහෝදරියන් වේ. මෙම තරඟාවලිය සඳහා අයදුම්පත් කැඳවීම විද්‍යුත් මාධ්‍ය, මුද්‍රිත මාධ්‍ය, රණවිරු සංසද, සේවා වනිතා ඒකක සහ සේවාවල සුභසාධක අධ්‍යක්ෂවරුන් මඟින් සිදු කරනු ලබන අතර එහි තරඟ අංශ පහත පරිදි වේ.

| රණවිරුවන් | දෙමාපිය/ බිරින්දෑවරුන් | රණවිරු දරුවන් |
|---|---|---|
| නර්තන/ බෙර වාදන/ ගායන/ වාදන/ පද්‍ය රචනා/ ගීත රචනා/ කෙටි කතා/ චිත්‍ර | අත්කම්/ පද්‍ය රචනා/ ගීත රචනා/ කෙටිකතා / ගීත ගායනා | නර්තන/ බෙර වාදනය/ ගායනා/ වාදන/ නිවේදන/ ගද්‍ය රචනා/ පද්‍ය රචනා/ කථික / චිත්‍ර |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

2017 රණවිරු සුවඳ සාහිත්‍ය උත්සවය ඔක්තෝම්බර් මස 28 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රුවන් විජයවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. මෙම උලෙළේදී සම්මාන, සහතික සහ මුදල් ත්‍යාග ප්‍රදානයන් පහත පරිදි සිදු කරන ලදි.

සම්මාන ලාභීන් රන් 68, රිදී 60 , ලෝකඩ 49
මුළු ගණන 177 (පදක්කම්ලාභීන් ගණන)
විශිෂ්ට කුසලතා 175

## 6.9. රණවිරු කාන්තා හා ළමා සංවර්ධන ඒකකය

රණවිරු සේවා අධිකාරියේ නව ව්‍යාපෘතියක් ලෙස ස්ථාපනය කළ රණවිරු කාන්තා හා ළමා සංවර්ධන ඒකකය 2017 වර්ෂය තුල පහත දැක්වෙන පරිදි සැලසුම් කරන ලදි.

- කාන්තා පවුර සංවිධාන ජාලය පිහිටුවීම.
- මූල්‍ය කළමනාකරණ හා සකසුරුවම්කම පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම
- රණවිරු කාන්තා බැහැරගත පුහුණු වැඩමුළු පැවැත්වීම.

- **<u>කාන්තා පවුර සංවිධාන ජාලය පිහිටුවීම.</u>**

ඒ අනුව, කාන්තා පවුර සංවිධාන ජාලය පිහිටුවීම සඳහා දිස්ත්‍රික් වැඩසටහන් නිළධාරීන්ගේ සහයෝගය ලබා ගනිමින් කාන්තා පවුර වැඩසටහන් 17 ක් පවත්වන ලදී.

- **<u>මූල්‍ය කළමනාකරණ හා සකසුරුවම්කම පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම</u>**



මූල්‍ය සකසුරුවම් බව වර්ධනය කිරිම, ඉතුරුම් වර්ධනය, චංචල හා නිශ්චල වත්කම් කලමනාකරණය , ආදයම් උත්පාදන වැඩසටහන් හඳුන්වා දීම, ඵලදායි ලෙස භාවිතා කළ හැකි ශ්‍රමය හා කාලයේ වටිනාකම යන අරමුණු ඇතිව මූල්‍ය කළමනාකරණ හා සකසුරුවම් පිළිබඳ පුහුණු වැඩමුළු පවත්වන ලද අතර 2017 වර්ෂයේදී වැඩමුළු 20 ක් පවත්වන ලදී.

ඒ අනුව, 2017 වර්ෂයේදි වැඩමුළු පැවැත්වීම පහත පරිදි සිදු කර ඇත.

| අනු අංක | දිනය | දිස්ත්‍රික්කය/ නගරය | පැමිණි පිරිස |
|---|---|---|---|
| 01 | 2017.06.27 | රත්නපුර | 240 |
| 02 | 2017.06.29 | කෑගල්ල | 265 |
| 03 | 2017.07.11 | බදුල්ල | 240 |
| 04 | 2017.07.17 | කළුතර | 150 |
| 05 | 2017.07.18 | ගම්පහ | 200 |
| 06 | 2017.07.19 | කොළඹ | 145 |
| 07 | 2017.07.20 | අනුරාධපුර | 140 |
| 08 | 2017.07.21 | පොළොන්නරුව | 140 |
| 09 | 2017.07.24 | පුත්තලම | 145 |
| 10 | 2017.07.25 | කුරුණෑගල | 235 |
| 11 | 2017.09.14 | ත්‍රිකුණාමලය | 147 |
| 12 | 2017.09.16 | අම්පාර | 140 |
| 13 | 2017.09.21 | මහනුවර | 120 |
| 14 | 2017.09.22 | මාතලේ | 210 |
| 15 | 2017.09.27 | මාතර | 136 |
| 16 | 2017.09.28 | හම්බන්තොට | 110 |
| 17 | 2017.11.10 | හඟුරන්කෙත | 130 |

| | | | |
|---|---|---|---|
| 18 | 2017.11.11 | වලපනේ | 47 |
| 19 | 2017.11.12 | කොත්මලේ | 90 |
| 20 | 2017.11.17 | ගාල්ල | 143 |

( මුලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

- **රණවිරු කාන්තා බැහැර ගත පුහුණු වැඩමුළු පැවැත්වීම.**

2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව රණවිරු කාන්තා හා ළමා සංවර්ධන ඒකකය මගින් රණවිරු බැහැරගත පුහුණු වැඩමුළු 04 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන් බලංගොඩ සමනළ වැව සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. මෙම වැඩමුළු පැවැත්වීමේ අරමුණු පහත පරිදි වේ.



- පශ්චාත් ව්‍යසන අක්‍රමතාවයන්ගෙන් පෙලෙන ( P.T.S.D ) කාන්තාවන් හා දරුවන්ගේ ආතති කළමනාකරණය කිරීම හා එය අවම කිරීම.
- ඉහත කණ්ඩායමේ දක්නට ලැබෙන පෞර්ෂ සංවර්ධනයේ ගැටළු අවම කිරීම.
- ඉහත කණ්ඩායමේ දක්නට ලැබෙන සාමාජීය ගැටළු අවම කිරීම. ( බාහිර සමාජය සමඟ ගැටුම් ඇති කර ගැනීම හෝ තනිව කටයුතු කිරීම, හුදකලාව ජීවත් වීමට ඇති කැමැත්ත වෙනස් කිරීම)
- සුභවාදී ආකල්ප හා තාර්කික සිතුවිලි අනුව කටයුතු කිරිමට සහ ලෝකය දක්නා ආකාරය වෙනස් කිරීම.
- බෝ නොවන රෝග වළක්වා නිවැරදි ආහාර රටාවකට පුහුණු කිරීම.

ඒ අනුව 2017 වර්ෂයේ වැඩසටහන් පහත පරිදි පවත්වා ඇත.

| අනු අංක | දින | පළාත/ දිස්ත්‍රික්ක | පැමිණි පිරිස |
|---|---|---|---|
| 01 | 2017.08.27, 28, 29 | සබරගමුව, ඌව, ගම්පහ | 120 |
| 02 | 2017.11.03, 04, 05 | ත්‍රිකුණාමලය, අම්පාර | 115 |
| 03 | 2017.12.08, 09, 10 | මධ්‍යම පළාත | 106 |
| 04 | 2017.12.10, 11, 12 | ගාල්ල, කුරුණෑගල | 140 |

( මුලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

## 6.10. ක්‍රීඩා අංශය

රට ජාතිය වෙනුවෙන් ශරීරාංග කැප කල රණවිරුවන්ගේ ක්‍රීඩා දක්ෂතාවන් ඇගයීම අරමුණු කර ගනිමින් රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා අංශය මගින් ජාතික ක්‍රීඩාව වන වොලිබෝල් ක්‍රීඩාව පිළිබඳ දක්ෂතාවය සහ කැමැත්ත ඇති ආබාධිත රණවිරුවන්ගෙන් සමන්විත ක්‍රීඩා කණ්ඩායම් පිහිටුවන ලදි.




ඒ අනුව, පිහිටුවාගත් කණ්ඩායම් සඳහා 2017.08.22 දින තේරීම් තරඟාවලිය සංවිධානය කරන ලද අතර එහිදි ඉදිරිපත් වූ සියලූ කණ්ඩායම් වලින් දක්ෂතම ක්‍රීඩකයින් තෝරා 30 දෙනෙකුගෙන්

සමන්විත සංචිතයක් පිහිටුවන ලදි. මෙම සංචිතය සඳහා 2017 වර්ෂයේ සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- ක්‍රීඩා සංචිතයේ ක්‍රීඩකයින්ගේ දක්ෂතාවයන් උසස් මට්ටමකට පත් කර ගැනීම සඳහා 2017.08.28 දින සිට 2017.08.31 දින දක්වා පුහුණු කඳවුරක් ජාතික තරුණ සේවා සභාවේ හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදි.
- විජයබා පාබල රෙජිමේන්තුව පැරා වොලිබෝල් කණ්ඩායම හා රණවිරු සේවා අධිකාරි පැරා වොලිබෝල් ක්‍රීඩකයන් අතර සුහද Sitting වොලිබෝල් තරඟයක් 2017.10.30 දින බෝයගනේ විජයබා පාබල රෙජිමේන්තු ගෘහස්ත ක්‍රීඩාගාරයේදී පවත්වන ලද අතර ජයග්‍රහණය රණවිරු සේවා අධිකාරී කණ්ඩායම හිමි කර ගන්නා ලදී.
- ජනාධිපති රන් කුසලාන වොලිබෝල් තරඟාවලියට සහභාගී වීම සඳහා ක්‍රීඩකයින්ගේ පුහුණු වැඩසටහනක් අඹේපුස්ස යුධ හමුදා සිංහ රෙජිමේන්තු ගෘහස්ත ක්‍රීඩාංගණයේදී 2017.12.22 දින සිට 2017.12.28 දින දක්වා පවත්වන ලදී.
- පොළොන්නරුව මහජන ගෘහස්ත ක්‍රීඩාගාරයේදී 2018.01.12 සහ 13 යන දිනයන් වලදි ජනාධිපති රන් කුසලාන පැරා Sitting වොලිබෝල් තරඟාවලිය සඳහා සහභාගී වීමට පෙර පුහුණු වැඩසටහනක් 2018.01.08 දින සිට 2018.01.11 දින දක්වා පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහන ජාතික තරුණ සේවා සභාවේ හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානයේ ගෘහස්ත ක්‍රීඩාගාරයේ පවත්වන ලදී.
- 2018.01.12 සහ 13 යන දෙදින තුල පොළොන්නරුව මහජන ගෘහස්ත ක්‍රීඩාගාරයේ දී ජනාධිපති රන් කුසලාන පැරා Sitting වොලිබෝල් තරඟාවලියේ ශූරතාවය රණවිරු සේවා අධිකාරි කණ්ඩායම විසින් ලබා ගන්නා ලදී.

## 6.11. රණවිරු ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරිම

රණවිරු ගම්මාන වලට අවශ්‍ය සේවාවන් සිදු කර ගැනීම සඳහා මුල්‍යමය දායකත්වය,භාණ්ඩ උපකරණ ලබාදීම හා ආයතන සම්බන්ධීකරණයන් සිදු කරමින් අවශ්‍ය සහයන් ලබා දීමත් මේ යටතේ සිදු කෙරේ. ඒ අනුව, 2017 වර්ෂයේදී පහත සඳහන් කටයුතු සඳහා සහය ලබා දී ඇත.

- කැකිරාව, මරදන්කඩවල රණවිරු ගම්මානයේ විදුලි වැටෙහි සම්ප්‍රේෂණ කුටිය ( Energy Cabin ) ඉදිකිරීම සඳහා අදාල නිළධාරීන් දැනුවත් කර අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීමට 2017.07.25 දින අනුරාධපුර වනජීවී සංරක්ෂණ කලාපයේ සහකාර අධ්‍යක්ෂතුමා වෙත දැනුම් දී අදාල කටයුතු සිදු කර ඇත.
- වහමල්ගොල්ලෑව, රඹෑව රණවිරු ගම්මානයේ භූගත ළිදේ නල පද්ධතිය හා විදුලි පද්ධතිය අලුත්වැඩියා කිරීම සම්බන්ධව ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුධ හමුදා මූලස්ථානය වෙත දැනුම් දෙන ලදී.
- උතුරු මැද පළාතේ ඇලහැර, දියබෙදුම රණවිරු ගම්මානයේ ජීවත්වන රණවිරු පවුල් වෙනුවෙන් බීමට ජලය ලබා ගැනීමට නළ ළිදක් ඉදිකර දීමට ජාතික ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලයට භූගත ජලය පරීක්ෂා කිරීම සඳහා රු. 48,875.00 ක මුදලක් ගෙවීම් සිදු කර ඇත.
- බලංගොඩ රණවිරු ගම්මානයට ජල හා මාර්ග පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා ගැනීම සඳහා සබරගමුව ආණ්ඩුකාරතුමා වෙත ලිපියක් මගින් දැනුම් දීම.

රණවිරු සේවා කාර්යයන් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය හෝ සියළු ක්‍රියා හා කටයුතු කිරීම වෙනුවෙන් 2017 වර්ෂයේ ප්‍රගතිය කරා ළඟා වීම පහත පරිදි වේ.

| අධිකාරියේ කාර්යයන් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය හෝ සියළු ක්‍රියා හා කටයුතු කිරීම | 2017 භෞතික | | 2017 මූල්‍ය (රු. මි) | |
|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | වෙන්කිරීම | ප්‍රගතිය |
| රණවිරු මාපිය සුරැකුම් වැඩසටහන | 1,416 | 1,433 | 32.74 | 32.03 |
| රණවිරු මාපිය රැකවරණ ප්‍රතිලාභ | 37,300 | 35,446 | 325.80 | 307.37 |
| රණවිරු සංසද දිස්ත්‍රික් දැනුවත් කිරීම් | 08 | 08 | 0.89 | 0.52 |
| ජාතික හා පළාත් රණවිරු දින සැමරුම් උත්සව පැවැත්වීම | 09 | 09 | 5.68 | 5.36 |
| මයිලපිටිය උද්‍යානයේ නඩත්තු හා සංවර්ධන කටයුතු | 01 | වර්ෂය පුරා නඩත්තු වියදම් දැරීම | 1.41 | 1.30 |
| යාකබැද්ද රණවිරු වැඩිහිටි නිවාසය | 01 | ඉදිකරමින් පවතී | 5.93 | 5.80 |
| " විරුසර " වරප්‍රසාද කාඩ්පත | | 38,119 | 1.00 | - |
| රණවිරු සුවඳ සාහිත්‍ය උත්සවය | 1 | 1 | 7.86 | 7.58 |
| රණවිරු කාන්තා හා ළමා සංවර්ධන වැඩසටහන් | 41 | 41 | 6.01 | 2.88 |
| ක්‍රීඩා අංශය | 1 | 1 | 0.70 | 0.52 |
| රණවිරු ගම්මාන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 4 | 2 | 1.00 | 0.25 |

( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )




( මූලාශ්‍රය - අභ්‍යන්තර සංඛ්‍යාලේඛන - රණවිරු සේවා අධිකාරිය )

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } ඩීඑෆ්/ඩී/ආර්එස්ඒ/1/17/11

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2018 ඔක්තෝබර් 17 දින

සභාපතිනිය,

රණවිරු සේවා අධිකාරිය

**රණවිරු සේවා අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

රණවිරු සේවා අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරි පනතේ 9(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් රණවිරු සේවා අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

---

## 2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට රණවිරු සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම අයත්වන දේපළ පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කල යුතුය. කෙසේවෙතත්, අධිකාරියේ ඉඩම් ගොඩනැගිලි වටිනාකමට ඇතුළත්වූ ප්‍රධාන කාර්යාල ඉඩම හා ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රත්‍යාගණනයකර එහි වටිනාකම ගිණුම්ගත කර තිබුණු නමුත් අධිකාරි විසින් 2013 වර්ෂයේදී අත්පත් කර ගෙන තිබුණු මයිලපිටිය ප්‍රදේශයේ පිහිටි රණවිරු උද්‍යානය, එහි පිරිවැය වූ රු.2,872,387 ක වටිනාකම මත ගිණුම්ගත කර තිබුණි.

(ආ) ප්‍රමිතයේ 90 ඡේදය ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී ප්‍රත්‍යාගණනය ක්‍රියාත්මක වන දිනය, තක්සේරුකරු පිළිබඳ තොරතුරු, වත්කම්වල සාධාරණ වටිනාකම ඇස්තමේන්තු කිරීමේදී අනුගමනය කල ක්‍රමවේදය සහ වැදගත් උපකල්පනයන් හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

----------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි ඡේද අංක 48 ප්‍රකාරව, අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකල යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා වූ රු.862,760 ක අඩමාන ණය අධි වෙන්කිරීම්, අධිකාරියේ ආදායමට බැර කිරීම වෙනුවට බොල්ණය වියදමෙන් අඩුකර දක්වා තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂවලදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු පර්චස් 24.90 ක් වූ ඉඩම් කොටස් 02 ක හිමිකම සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය වෙත පවරාගෙන තිබුණු නමුත් එහි වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, වටිනාකම රු.60,590,000 ක් ලෙස තක්සේරු කර තිබුණු අධිකාරියට අයත් වෙනත් ඉඩම් කොටස් 03 ක වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ) ඵලදායී ජීවිත කාලය පිළිබඳව සැලකිල්ලට නොගෙන පිරිවැය රු.11,239,262 ක් වූ විදුලි සෝපානයද, කාර්යාල ගොඩනැගිල්ල යටතේ ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර ගොඩනැගිල්ල සඳහා වූ සියයට 05 ක්ෂය අනුපාතය මත ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රතිලාභීන් වෙත ලබාදී තිබුණු ණය ශේෂය රු.100,053,628 ක් වුවත් විගණනය සඳහා ලබාදුන් කේවල ශේෂ සාරාංශ අනුව ණය ශේෂය රු.99,963,300 ක් වූයෙන් රු.90,238 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු ණය ශේෂය සඳහා වූ සේවා ගාස්තු ආදායම, රු.11,558,510 ක් වුවද කේවල ශේෂ සාරාංශය අනුව එම වටිනාකම රු.12,016,481 වූයෙන් රු.457,970 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

2009 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල බාහිර පාර්ශවයන්ගෙන් අධිකාරිය වෙත පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.2,310,336 ක්වූ විවිධ වත්කම් පිළිබඳ විස්තර ඇතුලත් පරිත්‍යාග ලේඛනය විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට නිවාස ණය ප්‍රතිලාභීන් 10 දෙනෙකුගෙන් ලැබිය යුතුව පැවති රු.595,709 ක ණය ශේෂයෙන් වර්ෂ 2 සිට 8 දක්වා කාලය තුල කිසිදු වාරිකයක් අයවී නොතිබුණු බව නිරීක්ෂණය විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 110 | අධිකාරිය විසින් හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින් හෝ කි.මී.25000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසු ඉන්ධන පරීක්ෂාවක් සිදුකළ යුතු වුවත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ වාහන සඳහා ඉන්ධන වැයවීම් පිළිබඳ පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. |
| (ඇ) | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අදාල කාර්යය නිමකල වහාම අත්තිකාරම් මුදල් පියවිය යුතු වුවත් 2014 වර්ෂය තුලදී අධිකාරියේ නිලධාරීන් දෙදෙනෙකුට අවස්ථා 5 කදී ලබා දී තිබූ රු.1,830,450 ක් වූ අත්තිකාරම් 2017 දෙසැම්බර් 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු. 61,412,678 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. රු.32,013,286 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.29,399,392 කින් තවදුරටත් පිරිහීමක් නිරීක්ෂණය විය. තවද සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ සමස්ත ආදායම රු.27,317,324 කින් වැඩි වී තිබුණද, සැපයීම් වියදම රු.4,342,661 කින්, ගිවිසුම්ගත සේවා වියදම රු.9,231,860 කින් හා ව්‍යාපෘති වියදම රු.23,523,754 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.12,301,556 ක්ව පැවති අධිකාරියේ මෙහෙයුම් ඌණතාවය පසු වර්ෂ වලදී තවදුරටත් පිරිහීමකට භාජනය වී තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වන විට එම අගය රු.61,412,678 ක ඌනතාවයක් බවට පත්වී තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසුව 2013 වර්ෂයේ අවසානයට පැවති රු.14,882,175 ක්වූ අධිකාරියේ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු.1,159,434 ක් දක්වා පිරිහී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යය සාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරි පනතේ 6 වන වගන්තිය අනුව ක්‍රියාන්විතයේදී ආබාධිත තත්ත්වයට පත්වූ රණවිරුවන් සහ මියගිය රණවිරුවන් හා සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලීසියේ සියලුම රණවිරුවන් සහ ඔවුන්ගේ යැපෙන්නන් පිළිබඳව තොරතුරු ඇතුළත් නාමලේඛනයක් අධිකාරිය ආරම්භ කර දින 60 ක් ඇතුළත පිළියෙල කර එය අඛණ්ඩව යාවත්කාලීන කළයුතු බව සඳහන් වුවත් අධිකාරිය ආරම්භ කර වර්ෂ 15 ක් ගත වුවද පරිපූර්ණ නාමලේඛනයක් සැකසීමට හා අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. මේ කාර්යය සඳහා රණවිරු සංසද 269 ක් පිහිටුවා වසර 11 ක් ගතවී තිබුණු අතර දත්ත පද්ධතියට අවශ්‍ය තොරතුරු රැස්කිරීම සඳහා 2011 සිට 2014 වර්ෂය දක්වා රු.12,958,801 ක මුදලක්ද වැයකර තිබුණු නමුත් මේ පිළිබඳ සිදුකල ගැඹුරු පරීක්ෂාවන් වලදී රණවිරු සංසද සාමාජිකයන් සහ ඔවුන්ගේ යැපෙන්නන් පිළිබඳ සම්පූර්ණ තොරතුරු අධිකාරිය සතුව නොපවතින බවට තොරතුරු අනාවරණය විය.

(ආ) රණවිරුවන්ගේ සුභසාධන කටයුතු සඳහා අධිකාරිය වෙත 2009 වර්ෂයේදී පරිත්‍යාග කර තිබුණු අකුරැස්ස යාකබැද්ද ප්‍රදේශයේ පිහිටි පර්චස් 302 නිවාසයක් සහිත ඉඩම ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් රු.9,366,285 ක වියදමක් දරා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සුභසාධන කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ) සමාලෝචිත වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂය තුළ අර්ධ නිවාස 450 ක්ද නව නිවාස 300 ක්ද ඉදි කිරීමට සැලසුම්කර තිබුණු අතර ඒ යටතේ 2017 දෙසැම්බර් 31 දින වන විට නව නිවාස 192 ක් ඉදි කිරීම සඳහා වාරික වශයෙන් මුදල් ලබාදී තිබුණි. එදිනට අර්ධ නිවාස සඳහා කිසිදු ප්‍රතිලාභියෙකුට නිවාස ණය ලබාදී නොතිබුණු අතර නව නිවාස ඉදිකිරීම සඳහා 15දෙනෙකු ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර රු.130,000 බැගින් රු.1,950,000 ක මුදලක් ලබාගෙන තිබුණු බව හෙළිදරව් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් පසු පරීක්ෂාවක් සිදුකිරීමේ කටයුතු දුර්වල මට්ටමක පැවතුනි.

(ඈ) අධිකාරිය විසින් රණවිරුවන් වෙත තාවකාලික බලපත්‍ර මගින් ලබාදී තිබුණු බලංගොඩ, කෑගල්ල, මීරිගම හා මාළඹේ පිහිටි ඉඩම් කොටස් 15කට අදාලව ඔප්පු සකස් කිරීමේ කටයුතු 2018 ජනවාරි 22 විගණන දින වන විටත් සිදු කර නොතිබුණි.

## 4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2004 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධිකාරියේ පරිගණක ක්‍රියාකරු තනතුරට පත්කර තිබුණු නිලධාරිනියක් 2009 දී වර්ෂ 02 කාලයක් සඳහා වැටුප් රහිත විදේශ නිවාඩු ලබාගෙන තිබුණු නමුත් බැඳුම්කරයේ කොන්දේසි කඩකර පසුව සේවයෙන් ඉවත්වී තිබුණි. මෙම නිලධාරිනියගෙන් අධිකාරියට අයවිය යුතු රු.530,380 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුනු අතර ඇයගේ පෞද්ගලික ලිපිගොනුවද අස්ථානගත වී තිබුණි.

## 4.3 දෘශ්‍ය අක්‍රමිකතා

රණවිරු මාපිය රැකවරණ දීමනා ක්‍රමය යටතේ එක් රණවිරු මවකට හෝ පියෙකුට වර්ෂයකට රු.9,000 බැගින් වූ දීමනාවක් පමණක් ගෙවිය හැකි වුවත් 2016 ජූනි මාසයේ සිට 2017 නොවැම්බර් මාසය දක්වාවූ මාස 18 ක කාලය තුල රණවිරුවෙකුගේ පියෙකු ලෙස හඳුනාගත් පුද්ගයෙකුගේ පෞද්ගලික බැංකු ගිණුමකට රු.819,750 ක් මුදලක් බැරකර තිබුණු බව නිරික්ෂණය විය. මීට අමතරව රණවිරුවෙකුගේ මව හෝ පියා නොවූ පිටස්තර පුද්ගලයෙකු වෙත උක්ත කාල සීමාව සඳහා රු.5,120,250 ක මුදලක් ගෙවා තිබුණු බවද විගණනයේදී නිරික්ෂණය විය. මේ සම්බන්ධව සිදුකර තිබුණු අභ්‍යන්තර පරීක්ෂණයේදී ඉහත ගෙවීම් සම්බන්ධයෙන් අක්‍රමිකතාවයක් සිදුවී තිබුණු බව තහවුරු කර තිබුණු අතර ඒ සඳහා නීතිමය පියවර ගැනීම සඳහා නිර්දේශ කර තිබුණි. මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව විසින් ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පැවතුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 4.4 නිශ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රණවිරු ප්‍රමුඛතා හැඳුනුම්පත් මුද්‍රණය සඳහා 2014 වර්ෂයේ රු.651,739 කට මිලදීගෙන තිබුණු මුද්‍රණ යන්ත්‍රයක් ඇතුලුව පිරිවැය රු.229,500 ක්වූ ඇගිලි සලකුණු යන්ත්‍ර 02 ක් හා පිරිවැය රු.42,158 ක්වූ පරිගණක මේස 06 ක් අධිකාරියේ පරිශ්‍රය තුල වර්ෂ 02 කට වැඩි කාලයක් නිශ්කාර්යව පැවතුනි. මීට අමතරව 2015 සැප්තැම්බර් මාසයේදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වටිනාකම රු.152,000 ක්වූ ලැප්ටොප් පරිගණක 04 ක් නිශ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණන වටිනාකම රු.62,625,000 ක් හා ප්‍රමාණය වර්ග අඩි 11548 ක් වූ ප්‍රධාන කාර්යාලයීය ගොඩනැගිල්ලේ වර්ග අඩි 2887 ක් වූ ඉහළ මහල 2001 වර්ෂයේ සිට ප්‍රයෝජනයට නොගෙන පැවති බව නිරික්ෂණය විය.

(ඇ) 2012 වර්ෂයේ මිලදී ගෙන තිබුණු මෝටර් රථය සඳහා සමාලෝචිත වර්ෂය තුල අළුත් වැඩියා වියදම් වශයෙන් රු.203,598 ක් වැයකර තිබුණු නමුත් කිලෝමීටර් 300 ක් පමණක් ධාවනය කර තිබුණි. තවද, අධිකාරිය සතු වටිනාකම රු.1,975,000 ක් වූ වෙනත් මෝටර් රථයක් සහ වටිනාකම රු.900,000 ක් වූ කැබ් රථය වර්ෂ 2 ක සිට නිෂ්කාර්යව අධිකාරිය තුළ පවතින බව නිරීක්ෂණය විය.

## 4.5 හඳුනා ගන්නා ලද පාඩු

---------------------

අධිකාරිය විසින් 2016 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබූ අතර 2017 වර්ෂය සඳහාවූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2018 මැයි 10 දින ඉදිරිපත් කර තිබුණි. එම වාර්තාවට අනුව විෂයයන් 31කට අදාල භාණ්ඩ 170 ක ඌනතාවයක් සිදු වි තිබුණු බවත් නිරික්ෂණය විය. මෙම අස්ථානගත භාණ්ඩ අතර ඩිජිටල් කැමරා 11 ක්ද අල්මාරි 4 ක්ද ,කඩබ් 2 ක්ද ලිපිගොනු රාක්ක 2 ක්ද බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර 1ක්ද, පෙන්ඩ්‍රයිව් (32 GB) 19 ක්ද විය.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරී පනතේ 5 (ඇ) වගන්තිය අනුව නිලධාරීන් සේවයේ නියුක්ත කිරීමේ බලතල අධිකාරියේ කළමණාකරණ මණ්ඩලය වෙත පවරා තිබුණු අතර සභාපතිනිය විසින් සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් 11 දෙනෙකු තනතුරුවලට පත්කර 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමණාකරන චක්‍රලේඛයේ ඇතුළත් එම්.එම්-1-1-2006 වැටුප් ක්‍රමයේ පියවර 06ක් ඉදිරියෙන් පිහිටුවා තිබුණු බව නිරීක්ෂණය විය. අධිකාරියේ සභාපතිනිය පැහැදිළි කිරීම අනුව, මෙම පත්කිරීම් සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා 2015 අගෝස්තු 31 දින අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය වෙත තොරතුරු ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත් කළමනාකරණ මණ්ඩලය විසින් වැඩිදුර විමර්ශනය සඳහා කමිටුවක් පත්කර තිබුණු අතර අදාල කමිටු වාර්තාවේ පිටපතක් විගණනයට ලැබී නොතිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව රණවිරු සේවා අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව දැනුවත් වී තිබුණු නමුත් එම කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුලත් කර නොතිබුණු බවත් එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට ඇතුලත් කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

**6. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2018 ජූනි 28 දිනය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------------------

### 6.1.1 ප්‍රසම්පාදනයන්

--------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් 2017 ජනවාරි මාසයේදී රු.3,776,250 කට මිලදී ගෙන තිබුණු විදුලි ජනක යන්ත්‍රය සම්බන්ධව ලංසු විවෘත කිරීම ඊට නියමිත දිනය වූ 2016 දෙසැම්බර් 01 දින වෙනුවට 2017 ජනවාරි 04 දින සිදු කර තිබුණි. තවද ලංසු විවෘත කිරීම සම්බන්ධව වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණු අතර ඒ හේතුවෙන් එම කටයුතු වල විනිවිද භාවය ගැටලු සහගත විය. මේ සම්බන්ධයෙන් කාර්ය සාධන බැඳුම් කර ලබා ගැනීමෙන් තොරව රු.2,620,000 ක අත්තිකාරම් මුදල් නිදහස් කර තිබුණු බවත් යන්ත්‍රය ස්ථානගත කර තිබුණු පරිශ්‍රය පසුව වෙනස් කිරීම නිසා අමතර වශයෙන් රු.729,750 පිරිවැයක් දරා තිබුණු බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) වර්ණ ඡායා පිටපත් යන්ත්‍රයක අවශ්‍යතාවය පිළිබඳ කිසිඳු ඉල්ලීමකින් තොරව රු.827,770 ක් වැයකර වර්ණ ඡායා පිටපත් යන්ත්‍ර දෙකක් සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණි. මේ සඳහා ලංසුකරුවන් 6 දෙනෙකු මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර අවශ්‍ය සුදුසුකම් සපුරා තිබියදීත් ඇගයීම් කමිටුව විසින් අවම ලංසුකරුවන් 3 දෙනෙකු අවශ්‍ය සුදුසුකම් සපුරා නැති බව දක්වමින් අවම 04 වන මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ලංසුකරුට කාර්ය සාධන ඇපකරයක් ලබා නොගෙන ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. එසේම එක් ඡායා පිටපතක් සඳහා වූ පිරිවැය සහ එහි නඩත්තු වියදම් පිළිබඳ ඇගයීම් සිදුකර නොතිබුණි.

## 6.2 අයවැය පාලනය

----------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේ අයවැය ලේඛනය 2018 වර්ෂයේ ජනවාරි මාසය තුලදීද සංශෝධනයට ලක්කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව අධිකාරියේ අයවැය ලේඛන පිළියෙල කිරීම වඩා තාත්විකව සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2003 ජූනි 02 දිනැති PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 වගන්තිය ප්‍රකාරව අයවැයගත ආදායම් වියදම් ප්‍රකාශය, අයවැගත මූල්‍ය තත්ව ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර ලද අයවැය ලේඛණයට ඇතුලත් කර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
දේසිய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**6.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

------------------------------

2002 මැයි 24 දිනැති අංක 21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රණවිරු සේවා අධිකාරිය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2015, 2016 වර්ෂයන්ට අදාල කාර්යසාධන වාර්තා 2018 ජූලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**07. පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර රණවිරු සේවා අධිකාරියේ සභාපතිනියගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කල යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ප්‍රසම්පාදනය | භාණ්ඩ මිලදී ගැනීම් සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු නොකිරීම. |
| (ආ) අත්තිකාරම් පාලනය | අත්තිකාරම් නිකුත් කිරීම, පියවීම හා ඒවා උපයෝජනය කිරීම සම්බන්ධව නිසි අධීක්ෂණයක් සිදු නොවීම. |
| (ඇ) අභ්‍යන්තර පාලනය | අධිකාරිය තුල පවතින අංශයන්හි කාර්යයන් මනාව ක්‍රියාත්මක කරවීමට හැකි වන පරිදි මනා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර නොතිබීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# අවසාන ගිණුම් ප්‍රකාශනය

# රණවිරු සේවා අධිකාරිය
## 2017-12-31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය

| | සටහන් | 2017 | | 2016 | |
|---|---|---|---|---|---|
| | | රු.ශත | රු.ශත | රු.ශත | රු.ශත |
| **වත්කම්** | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 1 | | 160,099,333.03 | | 128,640,679.95 |
| තැන්පතු | 2 | | 587,141.38 | | 245,641.38 |
| කලින් ගෙවීම් | 3 | | 281,679.25 | | 203,702.10 |
| ලැබිය යුතු ණය හා පොළී | 4 | 131,464,784.77 | | 217,565,340.95 | |
| අඩුකලා | | | | | |
| අඩමාණ ණය වෙන් කිරීම් | | 1,000,536.29 | | 1,863,296.98 | |
| | | | 130,464,248.48 | | 215,702,043.97 |
| ලිපිද්‍රව්‍ය තොග | 5 | | 1,194,524.82 | | 487,258.45 |
| එකතුව 01 | | | 292,626,926.96 | | 345,279,325.85 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| ස්ථාවර තැන්පතු | 6 | | 28,000,000.00 | | 28,000,000.00 |
| නොනිම් වැඩ | 7 | | 300,000.00 | | 12,305,946.51 |
| යටිතල.පිරියත හා උපකරණ | 8 | | 20,710,076.94 | | 18,046,261.48 |
| ඉඩම් හා ගොඩනැගිලි | 9 | | 231,713,776.55 | | 206,610,697.56 |
| එකතුව 02 | | | 280,723,853.49 | | 264,962,905.55 |
| **මුළු වත්කම්** (03=01+02) | | | **573,350,780.45** | | **610,242,231.40** |
| **බැරකම්** | | | | | |
| **ජංගම බැරකම්** | 10 | | 15,792,840.24 | | 14,158,114.66 |
| එකතුව 04 | | | 15,792,840.24 | | 14,158,114.66 |
| **ජංගම නොවන බැරකම්** | 11 | | 19,002,101.37 | | 16,035,081.70 |
| එකතුව 05 | | | 19,002,101.37 | | 16,035,081.70 |
| **මුළු බැරකම්** (06=04+05) | | | 34,794,941.61 | | 30,193,196.36 |
| **ශුද්ධ වත්කම්** (03-06) | | | **538,555,838.84** | | **580,049,035.04** |
| **ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | | | | |
| රණවිරු දූදරු සුවසෙත අරමුදල | | | 76,710.00 | | 105,710.00 |
| සේවක ණය චක්‍රීය අරමුදල | | | 10,005,801.86 | | 9,719,567.67 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | | 104,707,082.46 | | 81,835,290.21 |
| සමුච්චිත අතිරික්තය/(ඌණතාවය) | | | 423,766,244.52 | | 488,388,467.16 |
| **මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය** (01+02-06) | | | **538,555,838.84** | | **580,049,035.04** |

ඉහත මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය අංක 02 සිට 25 දක්වා පිටුවල සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්වල ගැලපීම් සමග කියවිය යුතුය.

කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් පරිදි පිළියෙල කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශණය ඉදිරිපත් කිරීමේ වගකීම කළමනාකරණ මණ්ඩලය විසින් භාරගන්නා ලදි. කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශණ අත්සන් කිරීමේ හා නිකුත් කිරීමේ අධිකාරී බලය සභාපතිතුමිය හා සහකාර අධ්‍යක්ෂ(මූල්‍ය) වෙත 2018-06-26 දින ලබාදෙන ලදි.

ටී.වී.සෙම්බුකුට්ටිආරච්චි
සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)
රණවිරු සේවා අධිකාරිය

අනෝමා ෆොන්සේකා
සභාපතිනි
රණවිරු සේවා අධිකාරිය

# රණවිරු සේවා අධිකාරිය
## 2017-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| | සටහන් | 2017 | 2016 |
|---|---|---|---|
| | | රු.ශත | රු.ශත |
| **ආදයම්** | | | |
| රජයේ දායකය (පුනරාවර්ථන) | **12** | 380,178,386.14 | 324,095,216.56 |
| සුපිර වාසනා සම්පත ලොතරැයි ආදයම | | 52,088,646.16 | 93,469,320.00 |
| පොලී ආදයම | **13** | 7,910,693.25 | 4,578,964.08 |
| සේවක ණය පොලී ආදයම | | 286,234.19 | 216,678.17 |
| සේවා ගාස්තු | **14** | 11,558,510.46 | 14,048,846.73 |
| රණවිරු කොඩි අලෙවි ආදයම | **15** | 5,255,196.27 | 4,576,517.00 |
| පරිත්‍යාග | **16** | 2,823,979.69 | 2,310,336.00 |
| වාහන අලෙවි ආදායම | **17** | 1,184,298.63 | - |
| රඳවාගත් ලාභ ගිණුම | | 4,980,632.23 | |
| සෙන්හිරු සියපත් ව්‍යාපෘතිය | | 4,111,975.00 | |
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ හා ටෙන්ඩර්පත් අලෙවි කිරීමේ ගාස්තු | | 42,700.00 | 25,900.00 |
| අඩමාණ ණය අධි වෙන්කිරීම් | | | 525,267.51 |
| වෙනත් ලැබීම් | **18** | 1,221,024.42 | 477,906.56 |
| **මුළු ආදයම** (01) | | 471,642,276.44 | 444,324,952.61 |
| **වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | **19** | 51,767,672.03 | 45,422,388.46 |
| ගමන් වියදම් | **20** | 1,311,342.34 | 879,316.78 |
| සැපයීම් | **21** | 8,477,836.33 | 4,135,175.68 |
| නඩත්තු වියදම් | **22** | 2,618,422.35 | 2,781,686.56 |
| ගිවිසුම්ගත සේවා | **23** | 21,528,786.41 | 12,296,926.87 |
| වෙනත් පුනරාවර්ථන වියදම් | **24** | 10,913,439.79 | 2,004,949.60 |
| ව්‍යාපෘති වියදම් | **25** | 421,925,728.61 | 398,402,154.37 |
| ක්ෂය කිරීම | | 10,804,439.88 | 10,104,189.97 |
| මූල්‍ය වියදම් | **26** | 175,097.02 | 311,449.95 |
| ප්‍රත්‍යාගණන අලාභ | | 3,532,189.64 | |
| **මුළු වියදම** (02) | | 533,054,954.40 | 476,338,238.24 |
| **කාලපරිච්ඡේදයේ මුළු අතිරික්තය/ (ඌනතාවය)** (01-02) | | (61,412,677.96) | (32,013,285.63) |

# රණවිරු සේවා අධිකාරිය
## 2017-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන් | 2017 | 2016 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | රු.ශත | රු.ශත |
| අතිරික්තය/(ඌනතාවය) | | (61,412,677.96) | (32,013,285.63) |
| **ගැලපීම්** | | | |
| ක්ෂය කිරීම | | **10,804,439.88** | 10,104,189.97 |
| පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම | | 1,619,723.02 | 2,055,286.00 |
| පොලී ආදායම | | (7,910,693.25) | (4,578,964.08) |
| රඳවාගත් ලාභ ගිණුම | | (4,980,632.23) | |
| ප්‍රත්‍යාගණන අලාභය (ලාභය) | | 3,532,189.64 | |
| වාහන අලෙවි ආදායම | | (1,184,298.63) | |
| අතිවිශේෂ අයිතම | | (2,965,826.36) | (324,600.06) |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීමට පෙර මෙහෙයුම් අතිරික්තය/(ඌනතාවය)** | | **(62,497,775.89)** | **(24,757,373.80)** |
